10-11 පිටුව

## 38 වසරක කොලොම්තොට අභිමානය

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකා රජයේ ලියාපදිංචි කරන ලදී.

## යහපත් වූ වරායක නත්තල් දැක්ම

පස්වන කාණ්ඩය / 10 වන කලාපය / 2017 අගෝස්තු/ සැප්තැම්බර්

## THE PORT IS BECOMING A CLEAN AND GREEN PLACE

07 පිටුව



## වරාය හා නාවික ගරු අමාත්‍ය මහින්ද සමරසිංහ මහතාගෙන් වරාය සංවර්ධනයට තුන් අවුරුදු සැළැස්මක්

03 පිටුව

# කිසිදු පාර්ශවයකට කිසිම ලෙසකින් ECT විකුණන්නේ නෑ

### ජනපති 38 වන සංවත්සරයේ දී පවසයි


Con. 10

සේවා ස්ථානයක සේවය කරන අතරතුර ලබන පුහුණුව, පුහුණුවෙන් පසු සේවයෙහි යෙදීම තරම්ම වටින්නේය. ඇතැම් විට ඉතා කලාතුරකින් ලැබිය හැකි අන්දමේ දුර්ලභ ගණයේ විශිෂ්ඨ පුහුණුවීම්, සේවා ස්ථානයකදී සේවය කරන අතරතුර ලද හැකි වන්නේ ය. එහෙත්, ඒ පිළිබඳව විමසිලිමත්වීම තුළින් සේවකයෙකු සිය සේවය වගකීමෙන් හා කැපවීමෙන් ඉටුකිරීමට පොළඹවන අතර, එමඟින් සිය සේවා ස්ථානයේ උන්නතිය උදෙසා හෙතෙම වැඩි වශයෙන් සිය බුද්ධිමය ශ්‍රමයත් කායික ශ්‍රමයත් දායාද කරන්නට පෙළඹෙයි.

සේවා ස්ථානයේ දී සිය කාර්යභාරය හා වගකීම් පිළිබඳ නිරන්තර සොයා බැලීමෙන් විමසිල්ලෙන් කටයුතු කරන තැනැත්තා, ඒ පිලිබඳ නව ප්‍රවණතා ද හඳුනා ගැනීමට සමත් වෙයි. ඒ අනුව නියමිත කාර්යයන් මැනවින් කඩිනමින් හා කාර්යක්ෂම භාවයෙන් යුක්තව ඉටු කර දීම උදෙසා ද ඒවා වඩාත් නිවැරදිව ඉටුකර දීම පිණිස ද හෙතෙම කටයුතු කරයි.

විශේෂයෙන්ම නව තාක්ෂණය සොයා ගැනීම කෙරෙහි වැඩි නැඹුරුවකින් යුක්තව අවධානයෙන් කටයුතු කිරීම, සේවා ස්ථානයක සේවා වඩාත් කාර්ක්ෂමව ඉටුකර දීමට මනා පුහුණුවක් සේවා ස්ථානය තුලදීම සපයා දෙයි. මෙසේ විචක්ෂණශීලිව කටයුතු කරන සේවකයකු හට සිය සේවා ආයතනයම විශ්ව විද්‍යාලයකින් බදු මාහැඟි අධ්‍යාපන මධ්‍යස්ථානයක් ම වන්නේය. ඒ පිළිබඳ හැඟීමෙන් හා ඇල්මෙන් යුතුව සිය කාර්යභාරය නිවැරදිව ඉටුකිරීමට පෙළඹීම මත පෙරළා හෙතෙම සිය බුද්ධිය ද, දැනුම ද, හදවත ද නිවැරදි ලෙසින් ශක්තිමත් කර ගන්නේ ය, පෝෂණය කර ගන්නේ ය. සිය කාර්ය භාරය මැනෙවින් ඉටු කිරීමට තරම් ආත්ම ශක්තියක් ද එය මැනෙවින් ඉටු කිරීමෙන් අනතුරුව මහත් වූ ආත්ම තෘප්තියක් ද විඳින්නේ ය.

සියලු දේ විමසිලිලෙන්, නිවැරදිව ඉටුකිරිමට පුහුණු වන තැනැත්තකු යම් සේවා ස්ථානයක අත්‍යාවශ්‍ය සේම ඉතා අගනා ජීව සම්පතක් ද වන්නේය. එවන් සම්පත් නිසි අයුරින් ආරක්ෂා කර ගැනීමටත්, අදාල අවස්ථාවන්හි දී මැනවින් තවදුරටත් පුහුණු කරවීමත්, ආයතනයක් මගින් ඉටුවිය යුතු කර්තව්‍යයකි. මෙසේ යම් සේවා ස්ථානයකදී සේවය කරන අතරතුර ශ්‍රමිකයකු ලබන පුහුණුව ඔහුගේ හෝ ඇයගේ සමස්ථ සේවා කාලය පුරාම පුරෝගාමී මෙහෙවරක් ඉටු කිරීමට මං පෙත් විවර කර දෙයි. එය මැනවින් වටහාගෙන සේවය කිරීමත් අවසාන එසේ කැපවීමෙන් හා වගකීමෙන් යුක්තව නිවැරදිව සේවය කරන සේවක මහත්ම මහත්මීන් හඳුනාගෙන ඔවුන් දිරිමත් කිරීමත්, සංවර්ධනය කරා පිය ඔසවන ජාතික ගමන් මගෙහි තව දුරටත් ධනාත්මක ඉලක්කයන් වෙත එවැනි පිරිස මෙහෙයවීමත් වගකිව යුතු අංශයන්හි පැහැර හැරිය නොහැකි වගකීමක් ද වන්නේ ය.



## සාමූහිකත්ව ප්‍රවේශය

**කළමණාකරණ කර්තෘ**
නලින් අපොන්සු

**නිරීක්ෂණය**
හර්ෂ උදයකාන්ත පීරිස්
කාව්‍ය ඉන්ද්‍රජිත්

**සංස්කරණය**
උපුල් ගුරුගේ

**පිටු සැකසුම**
උදිත චන්දන

**සහාය පිටු සැකසුම**
දිමුතු තෙන්නකෝන්

**පරිගණක අකුරු ඇමුණුම**
රේණුකා දමයන්ති

**තාක්ෂණික සහාය**
රුක්ෂාන් සමරධීර
අසංක රාජපක්ෂ

**ඡායාරූප**
ආලෝක අයි ද සිල්වා
ඩී.කේ. වැලිකල
මහින්ද තෙන්නකෝන්

**සම්බන්ධීකරණය**
දිල්රුක් ජයසේකර
සංජීව විජේසේකර
දේවිකා හෙට්ටිආරච්චි
සන්ධ්‍යා විතාන
එම්.එෆ්.එෆ්. ෆර්සානා

ශ්‍රී ලංකා වරාය අධිකාරිය
සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශයේ ප්‍රකාශනයකි

# වරාය භාවිතා කරන්නන්ගෙන්
# හම්බන්තොට වරාය ගිවිසුමට පැසසුම්

ශ්‍රී ලංකා නෞකා මෙහෙයුම්කරුවන්ගේ සංගමය - Sri Lanka Association of vessel operators (SLAVO) ශ්‍රී ලංකා නැව් භාණ්ඩ මෙහෙයුම්කරුවන්ගේ සංගමය - Sri Lanka Logistics & freight Forwarders Association (SLFFA), ශ්‍රී ලංකා නැව් නියෝජිතයන්ගේ සංගමය Ceylon Association of Shipping Agents(CASA) යන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වරාය භාවිත කරන්නන්ගේ සංවිධාන හම්බන්තොට වරාය සම්බන්ධයෙන් වන බදු ගිවිසුම පිළිබඳව රජය වෙත සිය ප්‍රසාදය පලකර සිටී.

පසුගියදා වරාය හා නාවික කටයුතු ගරු අමාත්‍ය මහින්ද සමරසිංහ මහතා හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා සමග හම්බන්තොට වරාය ගිවිසුම සම්බන්ධයෙන් පවත්වන ලද දැනුවත් කිරීමේ හමුවේ දී ඔවුන් මේ බව පවසන ලදි.

මෙහි දී අදහස් දක්වන ශ්‍රී ලංකා නෞකා මෙහෙයුම්කරුවන්ගේ සංගමය (SLAVO), මෙම ගිවිසුම දෙස ධනාත්මක කෝණයකින් බලන බව පවසයි. හම්බන්තොට වරාය බදුදීම තුළින් ශ්‍රී ලංකා රජය උපායමාර්ගික පියවරක් තබා ඇති බවත්, එය වෙළඳ මෙන්ම ආර්ථික වශයෙන් ද වාසිදායක බවත්, ඔවුන්ගේ අදහසයි. රජය විසින් ගත් මෙම පියවර ඔවුන්ගේ ද පැසසුමට ලක්වන අතර, එය ශ්‍රී ලංකාවේ වරාය හා නාවික ක්ෂේත්‍රයේ අනාගත වර්ධනයට හේතු වන බව ද වැඩිදුරටත් සඳහන් කර සිටී.

ශ්‍රී ලංකා නැව්භාණ්ඩ මෙහෙයුම්කරුවන්ගේ සංගමය (SLFFA) සඳහන් කරන්නේ මෙම බදුදීම නිසා කොළඹ වරාය ලද ණය සහනය කොළඹ වරායේ සහ අනෙකුත් වරායයන්වල ප්‍රගමනයට විශාල මූලාරම්භයක් සපයා ඇති බවයි.


CASA හෙවත් ශ්‍රී ලංකා නැව් නියෝජිතයන්ගේ සංගමය සඳහන් කරන්නේ, මෙම ඓතිහාසික ගිවිසුම මගින්, විශේෂයෙන්ම ලංකාවේ දකුණු පළාතේ ඇතිවන සුවිශේෂි සංවර්ධනය එම ප්‍රදේශයේ නොයෙක් රැකියා අවස්ථා උත්පාදනයට හේතුවන බවත්, එය, එම ප්‍රදේශයේ ජනතාවට ලැබෙන ප්‍රතිලාභයක් බවත් ය. එබැවින්, මෙම ගිවිසුම සම්බන්ධයෙන් රජය වෙත තම ප්‍රසාදය පල කරන බවයි.

මෙලෙස, විෂය පිළිබඳව ප්‍රායෝගිකව කටයුතු කරන සංවිධාන විසින් මෙම ගිවිසුම අගය කිරීම තුළින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සිය අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් ගන්නා ලද හම්බන්තොට වරාය සම්බන්ධයෙන් වන තීරණය ඉටුකොට ඇත්තේ ජාතික වුවමනාවක් බව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අදහසයි.

**සටහන - කාව්‍ය ඉන්ද්‍රජිත්**



## Mol Trust
## කොළඹ වරායට



ලොව බහලු නෞකා අතර විශාලත්වයෙන් දෙවැනි තැන හිමිකම ගන්නා Mol Trust බහලු නෞකාව කොළඹ වරායට සේන්දු විය. ස්වකීය පරීක්ෂාකිරීම් ගමන්වාරය අතරතුර ඇන්ජින් වේග පරීක්ෂාවක් සඳහා කොළඹ වරායට යාත්‍රා කළ මෙම නෞකාව මීටර් 400 ක දිගින් හා මීටර් 14.3 ක උසින් යුතුවේ. මාෂල් අයිලන්ඩ් ධජය යටතේ යාත්‍රා කරන Mol Trust නෞකාවේ අඩි විස්ස සම ඒකක 22170 බහලු ප්‍රමාණයක් ප්‍රවාහනය කළ හැකි අතර ආසියාවේ සිට යුරෝපය දක්වා ස්වකිය ගමන්වාර සිදු කරයි.

# වරාය හා නාවික ගරු අමාත්‍ය මහින්ද සමරසිංහ මහතාගෙන් වරාය සංවර්ධනයට තුන් අවුරුදු සැළැස්මක්





වරාය හා නාවික ගරු අමාත්‍ය මහින්ද සමරසිංහ මහතාගේ උපදෙස් මත ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වත්මන් සභාපති ආචාර්ය පරාක්‍රම දිසානායක මහතාගේ හා වත්මන් කළමණාකාරිත්වයේ මඟපෙන්වීම මත ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා ''තුන් අවුරුදු සංවර්ධන සැළැස්මක්'' සකස් කෙරෙයි. නාවික හා වරාය ක්ෂේත්‍රයේ වත්මන් ලෝක ප්‍රවණතා පිළිබඳව අවධානය යොමු කරමින් ඒ සඳහා මුහුණ දීමට අවශ්‍ය උපාය මාර්ගික සැළසුම් ඇතුලත් කොට මෙම සැළැස්ම සැකසෙමින් පවතී.

ශ්‍රී ලංකාවේ වරාය හා නාවික ක්ෂේත්‍රය එහි පසුගිය ස්වර්ණමය යුගය වෙත නැවත කැඳවාගෙන යාමේ වරාය හා නාවික ගරු අමාත්‍ය මහින්ද සමරසිංහ මැතිතුමාගේ පුළුල් දැක්ම හා බලාපොරොත්තුව වෙනුවෙන් ගත හැකි සෑම පියවරක් ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පෙරටුව සිටී. මෙම තුන් අවුරුදු සංවර්ධන සැළැස්මේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වත්මන් ආදායම වන රුපියල් බිලියන 44ක මුදල පෙර ලෙසම ද්විත්ව අංකයකින් (Double digit) එළඹෙන වසර 03ක කාලය තුළද පවත්වාගෙන යාමයි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්තයන්හි කාර්යක්ෂමතාව හා ඵලදායිතාව වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය උපායමාර්ගික සෑම පියවරක්ම ගැනීමට ගරු අමාත්‍යතුමාගේ උපදෙස් මත නව කළමණාකාරීත්වය කටයුතු කරමින් සිටී. ඒ යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය අනෙකුත් සියළු වරායන්හි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය සියළු ආකාරයේ උපාය මාර්ග පිළිබඳව ද, ඒවායේ ස්ථාපිත කළ හැකි ආකාරයේ ව්‍යාපාර අවශ්‍යතාවන් සඳහා අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීමට ද බලාපොරොත්තු වේ. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මානව සම්පත් සැළැස්මට ද අවශ්‍ය වැඩිදියුණු කිරීම් එක් කරන අතර, එහිදී වත්මන් සේවක සංඛ්‍යාව උපරිම ඵළදායිතාවයකින් යුතුව සේවයේ යොදවා ගැනීමට අවශ්‍ය හඳුනාගැනීම ද සිදු කරනු ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සිය පාරිභෝගික ප්‍රජාව කෙරෙහි සෑම අවස්ථාවකම ඉතා දැඩි අවධානය යොමු කර සිටින අතර, ඔවුන්ට උපරිම පහසුකම් සහිත විශිෂ්ඨ සේවාවක් ලබාදීම ද මෙම සැළසුමේ බලාපොරොත්තුවකි. මෙම නව සැළසුම කෙටුම්පත් කිරීමේ දී වරාය භාවිතා කරන්නන්, වෘත්තීය සමිති හා ව්‍යාපාරික ප්‍රජාවගේ අදහස් ලබා ගැනීමට ද නියමිතය. එමගින් වඩාත් සංවිධිත උපායමාර්ගික සැළසුමක් නිර්මාණය කිරීම තුළින් දැනට පවතින ලෙසම එළෙඹෙන වසර 03 තුළ ද්විත්ව අංකයකින් (Double digit)) යුතු වර්ධනයක් ලබා ගැනීමට බලාපොරොත්තු වේ.

-හර්ෂ-

## කොළඹ වරාය ලෝකයේ හොඳම වරායයන් 30 අතර 23 වැනි ස්ථානය ට









ජාත්‍යන්තර ඇල්ෆාලයිනර් **(Alphaliner)** වර්ග කිරීමට අනුව එහි 2017 පෙබරවාරි වාර්තා පරිදි 2016 වසරේ දී කොළඹ වරාය ලෝකයේ හොඳම වරාය 30 අතර 23 වන ස්ථානයට පත්ව තිබේ.

ලෝකයේ බහළු මෙහෙයුම් සිදු කරන වරායන් අතරින් සිදු කෙරෙන මෙම වර්ගීකරණයට අනුව 2015 වසරේ දී කොළඹ වරාය 26 වන ස්ථානයේ පසුවිය.

2016 වසරේ දී කොළඹ වරාය බහළු මෙහෙයුම් මිලියන 5.2 ක සිට 5.7 ක් දක්වා වර්ධනය කර ගැනීම හේතුවෙන් 10.6% ක වර්ධනයක් පෙන්වමින් බහළු මෙහෙයුම් වර්ධනය අංක දෙකකින් ළඟා කරගත් ලොව දෙවන වරාය ලෙසට පත්ව තිබේ.

එලෙස ප්‍රථමස්ථානයට පත්ව ඇත්තේ මැලේසියාවේ පෝට් ක්ලෑන්ග් (Port Kelang) ය. එහි වර්ධනය 10.8% කි.

කොළඹ වරායේ ප්‍රවේශ මාර්ග ගැඹුර, පර්යන්ත අද්දර ගැඹුර හා වරාය තඨාකය පුළුල්වීම, පර්යන්ත මෙහෙයුම් ධාරිතාවය පුළුල් වීම හේතුවෙන් ලෝකයේ ඕනෑම විශාල නෞකාවක් මෙහෙය වීමේ හැකියාව කොළඹ වරාය සතුව මේවන විට පවතී. මෙලෙස ධාරිතාව පුළුල්වීම හේතුවෙන් මෙම තත්ත්වය ළඟා කර ගැනීමට හැකිවීම පෙන්වා දිය හැකිය.

වරාය හා නාවික අමාත්‍යංශය යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ප්‍රමුඛතාවයන්ට අනුව තීන්දු තීරණ ගැනීමත් ජයබහළු පර්යන්තය, SAGT පර්යන්තය, CICT පර්යන්ත අතර අවබෝධයකින් හා සුහදතාවයකින් කටයුතු කිරීමත් මෙම ජයග්‍රහණයට හේතු ලෙස දැක්විය හැකිය.



# අසිරිමත් කොළොම්තොට මතක සුවඳ සහ පැහැබර හෙට දවස

**අතීතය, අනාගතය යා කරන නූතන සේද මාවතක සමුද්‍රීය සේවා සැපයීමේ විශිෂ්ඨයා බවට පත්වීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය යන ගමනේ දී එහි ඉතිහාසය මෙන්ම වරාය සංධිස්ථානයන් ද කිසිසේත්ම අමතක කළ නොහැක.**

ආසියා පැසිෆික් සමුද්‍රීය සේද මාවතේ උපාය මාර්ගික වැදගත්කම කේන්ද්‍රකර ගනිමින් අනාදිමත් කාලයක සිට විවිධ ජාතීන් විසින් ශ්‍රී ලංකාව විවිධ නාමයන්ගෙන් හඳුන්වනු ලැබීය.

ඉන්දියන් සාගරය මැද ඉන්දියානු අර්ධද්වීපයට දකුණින් පිහිටා ඇති ශ්‍රී ලංකා දිවයින බටහිර සිට නැගෙනහිරට සහ නැගෙනහිර සිට බටහිරට යාත්‍රා කළ ඓතිහාසික වෙළඳ හා සංචාරක නාවිකයන්ගේ ප්‍රකට නැව්තොටක් ලෙස පැවතුණි. නැගෙනහිර අප්‍රිකානු වෙරළබඩ ප්‍රදේශන්හි වූ වෙළඳ පොළවල් කරා සේද සහ පිඟන් භාණ්ඩ රැගෙන ගිය චීන නැව් කණ්ඩායම් සහ යුරෝපා වෙළඳසැල් කරා කුළුබඩු රැගෙන ගිය අරාබි යාත්‍රාවන් ද මෙම දීර්ඝ හා දුෂ්කර මුහුදු ගමනේ දී අතර මැද පිහිටි සියැලන්, සීලෝන්, තැප්රොබේන්, සෙරන්ඩිප් ආදි නාමකරණයන්ගෙන් හැඳින්වූ ලක්දිව පිළිබඳ දැන සිටිය හ.

එම දිවයිනේ පිහිටි මාන්තෙයි හෙවත් මාතොට, ගෝකණ්න හෙවත් ත්‍රී්මලය, ඌරාතොට හෙවත් කයිට්ස් ගොඩවාය ආදී වරායන් පිළිබඳවද දැන සිටියහ. ඉනිදු කොළොම්තොට හෙවත් කොළඹ වරායට හිමිවූයේ අද්විතීය ස්ථානයකි.

15 වන ශතවර්ෂයේ සිට කොළඹ වරායේ හිමිකම ලබන්නේ මෙරට ආක්‍රමණය කළ පෘතුගීසීන්, ලන්දේසී. ඉංග්‍රීසී යන බටහිර ජාතීන් ය. පෙර අපරදිග වෙළඳ කටයුතු සඳහා කොළොම්තොට ඇති වැදගත්කම පිළිබඳ ඔවුහු මනාව වටහා ගෙන සිටියහ. ඒ වන විට මෙරට පාලනය කළ රජවරුන්ට අවශ්‍ය වී තිබුණේ මුස්ලිම් වෙළඳ ආක්‍රමණිකයන්ගෙන් වෙරළ තිරය ආරක්ෂා කර ගැනීමට ය. මේ නිසාම වෙරළ තීරය ආක්‍රමණිකයන්ගෙන් බේරා ගැනීමේ උපාය මාර්ගයක් වශයෙන් VIII වන පරාක්‍රමබාහු රජතුමා විසින් පෘතුගීසීන් හට සිය වෙළඳ කටයුතු පවත්වා ගෙන යාම සඳහා කොළඹ වරාය භාවිත කිරීමට අවස්ථාව සලසා දී ඇත.

කුරුඳු වෙළඳාමේ අයිතිය ද ඔවුන්ට පවරා දෙන ලදී. ඒ සමගම මේ වෙරළ තීරයේ පූර්ණ අයිතිය පෘතුගීසීන් විසින් අත්පත් කර ගන්නා ලදී. 1815 දී ශ්‍රී ලංකාව බ්‍රිතානයන් අතට පත්වන අතර ඔවුන්ගේ වෙළඳ කටයුතු වලට මධ්‍යස්ථානයක් ලෙස කොළඹ නගරය තෝරා ගනී. ඒ සඳහා බලපෑ ප්‍රධාන සාධකය වන්නේ වරායක පිහිටීමයි.





කෘත්‍රිම වරායක් වශයෙන් කොළඹ වරායේ ආරම්භය සිදු වන්නේ මෙයින් පසුවය. ස්වභාවික වරායක් වශයෙන් පැවති ගාලු වරායේ දී බඩු නැව්වලට පැටවීමත්, නැව් වලින් ගොඩබෑමත් අති දුෂ්කර කාර්යයක් විය. 1877 විලියම් ග්‍රෙගරි ආණ්ඩුකාරවරයා කොළඹ වරායක් වශයෙන් ගොඩනැංවීමේ අවශ්‍යතාව ව්‍යවස්ථාදායක සභාවේ සැසිවාරයකදී පවසා තිබේ. කෙසේ වෙතත් ස්වභාවික වරායක් වශයෙන් පැවති ගාලු වරාය සංවර්ධනයත් කොළඹ කෘත්‍රිම වරායක් ඉදිකිරීම පිළිබඳ විවාදයත් දිගින් දිගටම පැවති ඇත. මේ කාලය වන විට කොළඹ තිබු බලකොටු ආදිය කඩා බිඳ දමා කොටුව ප්‍රදේශයෙහි නව වෙළඳ නගරයක් ද ඉදිවෙමින් පැවතිණි.

විදේශ වෙළඳ සමාගම් වැඩි ප්‍රමාණයක් කොළඹ පිහිටුවා තිබුණු අතර ඒ වන විට මෙරටින් පිටරටට යැවෙන භාණ්ඩ ප්‍රමාණයක ද වැඩි වෙමින් තිබුණි. මේ සියලු කටයුතු සඳහා වඩාත් සුදුසු මධ්‍යස්ථානය වූයේ කොළඹ වරායයි. මේ හේතුවෙන් ගාල්ල වරාය සංවර්ධනයට තිබු අවධානය ක්‍රමයෙන් අඩු වූ අතර කොළඹ වරාය වාණිජ්‍ය වරායක් වීමේ වැදගත්කම ඉස්මතු වන්නට විය. මේ යුගය වන විට කෝපි පිරටට යැවීම ශීඝ්‍රාකාරයෙන් වැඩි වන්නට වීමත් මෙහි තත්ත්වය වෙනස් වීමට බලපෑවේ ය.

1871 නොවැම්බර් මස 29 වැනිදා ලංකා වෙළඳ මණ්ඩල රැස්වීමේ දී කොළඹ වරායක් ඉදිකිරීමේ හැකියාව පිළිබඳ සොයා බලා වාර්තාවක් ලබා ගන්නා ලෙස වෙළඳ මණ්ඩලය කර ඇති ඉල්ලීම සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියා කිරීම පිළිබඳ මණ්ඩලයේ ස්තුතිය ආණ්ඩුකාරතුමන්ට දැන්විය යුතුවිය. මෙයට පිළිතුරක් ලෙස කොළඹ වරාය ඉදිකිරීමේ යෝජනාව ක්‍රියාත්මක කිරීමට තීරණය කෙරිණි.

අක්කර 4 1/2 ක භූමි භාගයක් පිරවීමට යෙදුණු අතර නිරිත දිග දිය කඩනය සඳහා මුල්ගල තැබීම සර් විලියම් ග්‍රෙගරි ආණ්ඩුකාරවරයාගේ කාලයේ ද එච්වඩ් වේල්ස් කුමරු අතින් සිදුවිය. මේ කටයුතු සඳහා දස වසරක් ගතවිය. වියදම පවුම් 705000 ක් විය. දියකඩනයේ මුළු දිග අඩි 4212 ක් වූ අතර අඩි 1350ක් අඩි 50 ක පළලකින් ද, ඉතිරිඅඩි 2862 අඩි 40ක පළලකින් ද යුතු විය. ටොන් 21 ක බරැති කොන්ක්‍රීට් කුට්ටි කලුගල් ඇතිරූ ගල් ගොඩක් මත තැබීමත් කරන ලදි. 1885 වසරේ දී දියකඩනය සාදා නිම වීමෙන් පසු කලින් පැවති විවෘත මුහුදු බොක්ක නිරිත දිගින් මනාසේ ආවරණය වූ වරායක් බවට පෙරළිණි. පළමුවෙන්ම කොළඹ වරායට පැමිණියේ ''රෝමය'' නැමැති නෞකාවකි. මෙයින් පසු පෙරදිග සහ ඕස්ට්‍රේලියාව බලා යන සියලුම දුම් නැව් සමාගම් වලට අයත් නැව් බඩු පැටවීම හා ගොඩබෑම සඳහා කොළඹ වරායට පැවතීම සිදුවිය.

පළමු ලෝක යුද්ධයත්, 1723 වර්ෂයත් අතර කාලසීමාවේ දී වරායේ සැළකිය යුතු වර්ධනයක් හැඳිනගත හැකිවිය. 1945 වසරේ ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු වරාය තුළ ශීඝ්‍ර දියුණුවක් ඇතිවිය. 1956 වර්ෂයේදී එතෙක් පැවති සංගම් ක්‍රමය වෙනුවට කොළඹ වරාය ජනසතු වීම සිදුවිය. ඒ අනුව වරාය කොමිෂන් සභාව, නැව්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය, සැසදුම් හා ආරක්ෂක සේවා සංස්ථාව යන ආයතන බිහිවන අතර 1979 අගෝස්තු 01 වන දින මෙම ආයතන ත්‍රිත්වය එක්කරමින් එවකට ගරු වරාය හා නාවික අමාත්‍යවරයාව සිට දිවංගත ලලිත් ඇතුලත්මුදලි මහතා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද සංශෝධිත 1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පිහිටුවීමේ පනත මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය ස්ථාපිත විය.

1980 වසරේ අගොස්තු මස 01 වැනි දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය පළමු සංවත්සරය සමරන එළිසබෙත් රැජින පර්යන්තයේ කොටසක් බහලු නෞකා මෙහෙයවීම් කටයුතු සඳහා උපයෝගී කර ගැනීමට හැකි වන පරිදි සංවර්ධනය කරන ලදි. එහි ප්‍රථම පියවර ලෙසින් ටැංගෙ ් වර්ගයට අයත් ග්‍රැන්ට් දොඹකරයක් කුලී පදනම යටතේ මෙහෙයවීමේ කටයුතු සඳහා යොදවා ගැණුනි. එය දකුණු ආසියානු කලාපයේ මෙහෙයුම් සිදුකළ ප්‍රථම දොඹකරය ලෙස සමුද්‍ර ඉතිහාසයයට එක්විය. සමුද්‍රික ඉතිහාසය දක්වන තොරතුරු අනුව කොළඹ වරාය බහලු මෙහෙයුම් ආරම්භ කරනුයේ 1972 වර්ෂයේ දී APL නෞකාවක සිට බත්තලකට බහලු මෙහෙයුම් සිදු කරමිනි.

එසේ ආරම්භ වූ කොළඹ වරායේ බහලු මෙහෙයුම් ක්‍රියාවලිය අද දවසේ කොළඹ වරාය ලෝකයේ හොඳම වරායයන් 30 අතර 23 වැනි ස්ථානය කරා ගෙන ඒමට සමත්ව ඇත.

**සටහන -උපුල් ගුරුගේ**

# ශ්‍රී ලංකා වරාය අධිකාරිය අභිමානවත් 38 වන සංවත්සරය සමරයි

වරාය අධිකාරියේ අනාගතය යහපත් පරිවර්තනයකට මුල පුරන 38 වන සංවත්සර සැමරුම් උත්සවය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රමුඛ ඇමතිතුමන්ලාගේ සහභාගීත්වයෙන් නැගෙනහිර පර්යන්ත පරිශ්‍රයේ දී පැවැත් විණි.

ආසියානු කලාපයේ තරගකාරී වරායයන් අතර උරෙනුර ගැටෙමින් කටයුතු කරමින් කේන්ද්‍රීය වරායක් කරා යන ගමනේ දී පසුගිය කාල වකවානුව තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය අත්පත් කරගත් ජයග්‍රහණයන් අති විශාලය.

ශ්‍රී ලංකා ආර්ථිකයේ සංවර්ධන උදෙසා ශ්‍රී ලංකාවේ වරායයන් නිරන්තරයෙන් මහගු කාර්යභාරයක් ඉටුකර ඇත. ඒ සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම සේවකයින් කාර්යක්ෂමව හා කැපවීමෙන් යුතුව සිය රාජකාරි ඉටුකරමින් දක්වූ සහාය අතිමහත් ය.

කොළඹ වරායේ 2016 මුල් 6 මස තුළ මෙහෙයුම් කරන ලද මුළු නැව් බඩු ප්‍රමාණය මෙට්‍රික් ටොන් මිලියන 40 ක් වූ අතර 2017 වර්ෂයේ මුල් 6 මස තුළ එම ප්‍රමාණය මෙට්‍රික් ටොන් මිලියන 42.6 ක් දක්වා 7.1% කින් වර්ධනය කර ගැනීමට හැකිවී ඇත. මීට සාපේක්ෂව මෙහෙයුම් කරන බහලු ප්‍රමාණය විස්සේ සම ඒකක මිලියන 2.7 සිට විස්සේ සම ඒකක 2.9 දක්වා 6.1% කින් වර්ධනය කර ගැනීමට හැකිවී ඇති බව මෙහිලා සඳහන් කළයුතු වේ. තවද 2016 මුල් 6 මස තුළ ප්‍රධාන නෞකා වල පැයකට මෙහෙයුම් කරන ලද බහලු ප්‍රමාණයේ සාමාන්‍ය 25.82 ක් වූ අතර 2017 වර්ෂයේ මුල් 6 මස තුළ එම ප්‍රමාණය 26.68 දක්වා වර්ධනයක් ලබාග ැනීමට හැකිවී ඇත. තවද පෝෂක නෞකා සම්බන්ධයෙන් 2016 වර්ෂයේ මුල් 6 මස තුළ පැයකට මෙහෙයුම් කරන ලද බහලු සංඛ්‍යාව 21.13 ක් වූ අතර 2017 වර්ෂයේ මුල් 6 මස තුළ පැයකට මෙහෙයුම් කරන ලද බහලු සංඛ්‍යාවේ සාමාන්‍යය 23.52 දක්වා වැඩිකර ගැනීමට සමත්වී තිබේ.

කොළඹ වරායේ නැගෙනහිර බහලු පර්යන්තයේ (ECT) සියලු ඉදිකිරීම් කටයුතු මීටර් 600 ක දිගින් යුතුව අවසන් කර ඇති අතර එම පර්යන්තයේ බහලු මෙහෙයුම් කටයුතු ඉදිරියේදී ආරම්භ කිරීමට නියමිතව ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ හදවත වැනිවූ ජය බහලු පර්යන්තයට 2017 වර්ෂයේ අභියෝග රැසකට මුහුණ දීමට සිදුවී තිබේ. මෙහිදී අපගේ ගණුදෙනුකාර භවතුන් අප වෙත රඳවා ගැනීමේ අපේක්ෂාවෙන් පර්යන්තය මගින් සපයනු ලබන සේවාවන්හි ගුණාත්මක තත්වය ඉහළ නැංවීමක් හා පර්යන්තයේ පරිපාලන කටයුතු වඩාත් ක්‍රමවත්ව ඉටුකිරීම තුළින් ජය බහලු පර්යන්තයේ ප්‍රතිරූපය තවදුරටත් වර්ධනය කර මෙම පර්යන්තය කොළඹ වරායේ අනෙකුත් පර්යන්තයන් අතර ආකර්ෂණීය පර්යන්තය බවට පත්කිරීමට සැළසුම් සකස් කොට ඒවා ක්‍රියාත්මක කරමින් සිටී. ජය බහලු පර්යන්තය 2016 වසරේදී ISO-9001/2015 තත්ව සහතිකය හිමිකර ගත් අතර එය කොළඹ වරාය තුළ ක්‍රියාත්මක වන බහලු පර්යන්ත අතරින් ISO-9001/2015 තත්ව සහතිකය ලත් පළමු හා එකම බහලු පර්යන්තය වීමත්, රාජ්‍ය ආයතනයක් විසින් ලබාගත් සුවිශේෂී ජයග්‍රහණයකි. තවද වරාය අධිකාරියේ සේවයේ නියුතු කාන්තාවන් ගැන්ට්‍රි දොඹකර ක්‍රියාකරවන්නියන් ලෙස ඉදිරියේදී පත්වීම් කිරීම සඳහා පුහුණුකර දැනට ජය බහලු පර්යන්තයේ ට්‍රාන්ස්ෆර් දොඹකරවල සේවාස්ථ පුහුණුවේ යොදවා ඇත.

2017 ජුනි මාසය දක්වා කාලය තුළදී නැව් සමාගම් 03 ක් සමග ගිවිසුම් ගතවීමට හැකියාව ලැබුණු අතර මේ වනවිට තවත් ප්‍රධාන නැව් සමාගමක් සමග ගිවිසුම් ගතවීම සඳහා අවශ්‍ය කාර්යයන් සිදුකරමින් පවතී. තවද එක් පෝෂක නැව් සේවාවක් අලුතින් සේවා ලබාගැනීම සඳහා පැමිණ තිබේ.

කොළඹ වරායට නව මුහුණුවරක් ලබාදීම සඳහා Re-Branding ප්‍රති සන්නාම කරණයක් සිදුකිරීමට සැළසුම් කර ඇති අතර එමගින් වරාය අධිකාරිය ඉදිරියේදී අළුත් මුහුණුවරක් ගනු ඇත. වරාය අධිකාරිය සඳහා අලුතින් ව්‍යාපාරික සැලැස්මක් සකස් කිරීමට කටයුතු සූදානම් කරමින් පවතින අතර ඒ තුළින් ඉදිරි වර්ෂවල වරාය අධිකාරියේ ආදායම් තත්වය ඉහළ නංවා ගැනීම සඳහා කටයුතු සැළසුම් කරමින් පවතී.

2017 වර්ෂය තුළදී බණ්ඩාරනායක පාලම හා නියමු පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීමට හැකිවූ අතර, CFS-I ගුදමේ ප්‍රතිසංස්කරණ කටයුතු සම්පූර්ණයෙන්ම නිමකර එහි භාණ්ඩ නිශ්කාශන කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර තිබේ. මෙම බහලු මෙහෙයුම් මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු ඇරැඹීමත් සමග නෞකාවක මෙහෙයුම් කටයුතු අවසන්ව පැය 48 ක් ඉකුත්වීමට මත්තෙන් සියලු බහළු ගුදම්ගත කිරීම දක්වා වූ ප්‍රගතියක් මේ වනවිට ලබා ඇත.

විවිධ රටවල බහලු (MCC) මෙහෙයුම් කිරීම බණ්ඩාරනායක තටාක ගුදම් සංකීර්ණය හරහා සිදුකරනු ලබන අතර, එකම අංශයක් තුළදී සියලුම මෙහෙයුම් කටයුතු සිදුකිරීම නිසා ප්‍රති අපනයන නැව්බඩු බහළු ගත කිරීමේ (Stuffing) කාර්යයෙහි විශාල ප්‍රගතියක් ඇතිවී ඇත.

මේ අතරතුර රජයේ ප්‍රතිපත්ති ශක්තිමත් කරමින් ගාල්ල වරාය, ත්‍රිකුණාමල වරාය, ඔලුවිල්, කන්කසන්තුරේ හා පේදුරුතුඩුව වරායන් ද සංවර්ධන කිරීමේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර හම්බන්තොට වරාය රාජ්‍ය පෞද්ගලික හවුල්කාර සමාගම් සමග එක්ව සේවකයින්ට/ආයතනයට වාසිදායක වන අයුරින් ආදායම් ලබා, ලාභ ලැබිය හැකි තත්වයට පත්කිරීමේ කටයුතු ද ක්‍රියාත්මක වෙමින් පවතී.

අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව සේවක දිනය ප්‍රකාශයට පත්කිරීම තුළින් සේවක මහත්ම මහත්මීන්ගේ රාජකාරිමය ගැටලු හා දුක්ගැනවිලි ලිඛිතව ලබාදීමට අවස්ථාව සලසා ඒවා විමර්ශනය කිරීම සඳහා කමිටුවක් පත්කර ඒ තුළින් එම ගැටලු විසඳා සහන ලබාදීම තුළින් සේවක තෘප්තිය වැඩිකිරීමට කළමණාකාරිත්වයට හැකිවීම ද ලැබූ ජයග්‍රහණ අතර සුවිශේෂී වේ. එමෙන්ම, බඳවා ගැනීමේ පටිපාටිය සමාලෝචනය කර සංශෝධනය කර සේවක උසස්වීම් නිසි පරිදි සිදුකිරීමට ද කටයුතු කරමින් පවතී.

සේවක සුභසාධන කටයුතු ද වඩාත් පුළුල්ව සිදුවන අතර සේවකයින්ට නොමිලේ සපයන ආහාරවල ගුණාත්මක භාවය හා සෞඛ්‍යාරක්ෂිත බව වැඩිදියුණු කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. සේවක දැනුම හා කුසලතාවයන් වර්ධනය කිරීම පිණිස ආරම්භ කළ ISO තත්ත්ව සහතිකයට අනුකූලව දැනුම ලබාදෙමින් පවත්වාගෙන යන මහපොළ අභ්‍යාස ආයතනය, මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය නමින් නම් කර ඇති අතර ඉදිරියේදී එය විශ්ව විද්‍යාල මට්ටමට උසස් කිරීමට කටයුතු කරනු ලබනු ඇත.

**සටහන - උපුල් ගුරුගේ**





# යළි ගොඩනැගුණු CSF-I බහලු මෙහෙයුම් මධ්‍යස්ථානය ප්‍රේෂණලාභීන්ගේ අයිතියට









නැවත ගොඩනගන ලද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ CFS-1 බහලු මෙහෙයුම් මධ්‍යස්ථානය දෙවන අදියර පසුගිය දා වරාය හා නාවික කටයුතු අමාත්‍ය මහින්ද සමරසිංහ මැතිතුමා අතින් විවෘත විය. මෙහිදි අදහස් දක්වූ වරාය හා නාවික අමාත්‍ය මහින්ද සමරසිංහ මැතිතුමා,

**''තමා විෂයභාර ඇමතිවරයා ලෙසින් වැඩ භාර ගැනීමෙන් අනතුරුව වරායේ ඉදිරි කටයුතු සැළසුම් කිරීම සඳහා වෘත්තීය සම්ගම් ඇතුළු සියලු පාර්ශවයන් සමග කටයුතු කිරීමට සූදානම් බවත්, දේශපාලන මතිමතාන්තරයකින් තොරව ආයතනික වශයෙන් හා රටක් ලෙසින් පෙරට යාමට සාමුහිකත්වයෙන් ඒකරාශිව අත්වැල් බැඳගත යුතු බවත් පැවසීය.''**

**එසේම, සියලු වෘත්තීය සම්ගම් විසින් කරන ලද ඉල්ලීම් සලකා බලා අනාදිමත් කාලයක සිට කීර්තියක් උසුලන වරායේ බත්පතෙහි ගුණාත්මක භාවය ඉහල නංවාලීමට මෙන්ම සේවක සුභසාධනය වර්ධනය කිරීම තුළින් කාර්යක්‍ෂමතාව නංවාලීමට අපේක්‍ෂා කරන බවත් පැවසීය.**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවා දායකයන් වෙත ප්‍රශස්ත සේවාවන් ලබා දීමේ අරමුණෙන් බහලු මෙහෙයුම් මධ්‍යස්ථාන පහසුකම් පුළුල් කිරීමට පියවර ගෙන ඇත. ඒ යටතේ වර්ග මීටර් 5100 ක ප්‍රමාණයකින් යුතු මෙම බහලු මෙහෙයුම් මධ්‍යස්ථානය අර්ධ පූර්ණ බහලු මෙහෙයුම් (LCL) සහ ප්‍රතිඅපනයන (Transshipment) නැව් භාණ්ඩ මෙහෙයුම් කිරීම සඳහා වූ පහසුකම් වඩා පුළුල් කිරීමේ අරමුණෙන්, නවීන තාක්‍ෂණය උපයෝගී කරගනිමින් ඉදිකර ඇත. ගිනි අවදානම් හඳුනා ගැනීමේ නූතන උපාංග පද්ධතියකින් හා ගුදම් කළමණාකරණ මෙහෙයුම් පද්ධතියක් ඇතුළු ලෝකයේ තරගකාරී වරායයන් සතු ගුණාත්මක හා ඵලදායිතාවයෙන් අනූන බහලු මෙහෙයුම් මධ්‍යස්ථානයක් සතු සියලු අංගෝපාංග යන්ගෙන් මෙම CFS-1 බහලු මෙහෙයුම් මධ්‍යස්ථානය සමන්විත වේ.

මෙහි අන්තරායකර නැව් බඩු මෙහෙයුම් කටයුතු සඳහා වර්ග මීටර් 1000 ක වපසරියක් හා සාමාන්‍ය නැව්බඩු මෙහෙයුම් කටයුතු සඳහා වර්ග මීටර් 4000 ක් වෙන් කර ඇත.

2013 වසරේ මැයි මාසයේ දී හදිසියේ ඇති වූ ගිනි ගැනීමකින් මුළුමනින්ම විනාශයට පත් වූ CFS-1 බහලු මෙහෙයුම් මධ්‍යස්ථානය හේතුවෙන් විවිධ දුෂ්කරතාවලට මුහුණදීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට සිදුවිය. මෙම ගැටලුවලට පිළියමක් ලෙස ගුදම් පහසුකම් පුළුල් කරමින් හා යාවත්කාලීන කරමින් වත්මන් මෙම CFS-1 මධ්‍යස්ථානය නැවත ගොඩ නැංවීම සිදුවිය.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විවිධ කොට්ඨාශයන්ගේ පූර්ණ ශක්තිය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උන්නතිය උදෙසා යොදා ගනිමින් මෙම බහලු මෙහෙයුම් මධ්‍යස්ථානය ඉදිකර ඇත. එහිදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සැලසුම් හා සංවර්ධන, කොන්ත්‍රාත් හා සැලසුම්, සිවිල් හා විදුලි ඉංජිනේරු අංශය ප්‍රමුඛ ඉංජිනේරු කොට්ඨාශයන් හා ක්‍රියාකරවන කොට්ඨාශයේ බර එසවුම් දොඹකර කාර්යය මණ්ඩලයේ පූර්ණ ශ්‍රම දායකත්වය හා තාක්‍ෂණය උපයෝගී කර ගැනීම හේතුවෙන් මෙය ඉදිකිරීම සඳහා රු. මිලියන 175 ක භාණ්ඩ පිරිවැයක් පමණක් වැය වීම සුවිශේෂී කරුණකි.

වර්තමාන තත්ත්වය සැළකීමේ දී ප්‍රධාන නෞකා සේවාවන් කොළඹ වරාය වෙත ආකර්ශනය කර ගැනීමට හැකිවීම නිසා 2016 වසරේ දී කොළඹ වරාය බහළු මෙහෙයුම් මිලියන 5.2 ක සිට 5.7 ක් දක්වා වර්ධනය කර ගැනීම හේතුවෙන් 10.6% ක වර්ධනයක් පෙන්වමින් බහළු මෙහෙයුම් වර්ධනය අංක දෙකකින් ළඟා කරගත් ලොව දෙවන වරාය ලෙසට පත්ව තිබේ. කොළඹ වරායේ ප්‍රවේශ මාර්ග ගැඹුර, පර්යන්ත අද්දර ගැඹුර හා වරාය තටාකය පුළුල්වීම, පර්යන්ත මෙහෙයුම් ධාරිතාවය පුළුල්වීම හේතුවෙන් ලෝකයේ ඕනෑම විශාල නෞකාවක් මෙහෙයවීමේ හැකියාව කොළඹ වරාය සතුව මේවන විට පවතී. මෙලෙස ධාරිතාව පුළුල්වීම හේතුවෙන් මෙම තත්ත්වය ළඟා කර ගැනීමට හැකිවීම පෙන්වා දිය හැකිය. මෙවන් තත්ත්වයක් තුළ CFS-1 බහලු මෙහෙයුම් මධ්‍යස්ථානය පූර්ණය කිරීමට හැකි වීම කොළඹ වරායේ කාර්යක්‍ෂම මෙහෙයුම් ක්‍රියාවලිය සඵලදායි ලෙස යාවත්කාලින කිරීම රුකුලක් වනු ඇත.

මේ කරුණු කාරනා සලකා බලමින් වරාය ඇතුලත දේශීය අර්ධ පූර්ණ බහලු මෙහෙයුම් සිදු කිරීමටත් ප්‍රතිඅපනයන නැව් භාණ්ඩ මෙහෙයුම් කිරීම සඳහා වූ පහසුකම් තව තවත් පුළුල් කිරීමට මෙම CFS-1 බහලු මෙහෙයුම් මධ්‍යස්ථානය විවෘත කිරීමේ අපේක්‍ෂාවයි.

**සටහන -උපුල් ගුරුගේ**

## වරායේ ඩෙංගු මර්ධනයට කඩිනම් පියවර





පිවිතුරු හෙටක් සුවබර දිවියක් තේමා කර ගනිමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඩෙංගු මර්ධන කලාපයක් ලෙසින් සංවර්ධනය කිරීමට පියවර ගැනේ. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උප සභාපති පී.ජී. දසනායක මහතාගේ මගපෙන්වීම යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය අධිකාරියේ වෛද්‍ය කොට්ඨාශයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරිනි ඩී. රාජකාන්තන් මහත්මිය ඇතුළු වෛද්‍ය කොට්ඨාශයේ දායකත්වයෙන් යුතුව සියලුම කොට්ඨාශ නියෝජනය වන සේ සංවිධානය කළ ඩෙංගු මර්ධන කමිටුව තුළින් මේ සඳහා විවිධ වැඩසටහන් හා ක්‍රියාකාරකම් විවිධ අංශ කොට්ඨාශ මට්ටමින් පැවැත්වීමට පියවර ගෙන ඇත. ඒ යටතේ කොට්ඨාශ සහ අංශ මට්ටමින් ඩෙංගු මදුරුවන් බෝවිය හැකි ස්ථාන අනාවරණය කර ගනිමින් එම ස්ථාන පිරිසුදු කිරීමටත් ඒ සඳහා සේවක මහත්ම මහත්මීන් දැනුවත් කිරීම හා දැනුම තොරතුරු යාවත්කාලීන කිරීම තුළින් ඩෙංගු මදුරුවාගෙන් තොර වරායක් ගොඩනැගීමට පියවර ගෙන ඇත. අබලි ටයර තැනින් තැන ගොඩ ගැසීම වෙනුවට ඒවා ඉවත් කරන තෙක් නිශ්චිත ගුදම් ගත කිරීම කටයුතු පවත්වාගෙන යාම, වර්ගීකරණයකට ලක් කරමින් කැළි කසල ඉවත් කිරීමේ ක්‍රියාවලිය, ජලය රැඳී ඇති ස්ථාන සොයා බලා එම ස්ථාන ජලය නොරැඳෙන අයුරින් සකස් කිරීම, කානු සහ ජලය ගලා යන මාර්ග අවහිර නොවන සේ සකස් කිරිම, ගලායන වතුර ටැංකිවල ආවරණ කර තැබීමට පියවර ගැනීම, ඇතුළු ක්‍රියාකාරකම් රැසක් මේ යටතේ සිදු කෙරේ.

මෙම ඩෙංගු මර්ධනයට අදාල කටයුතු අධීක්ෂණය කිරීම සඳහා ඩෙංගු මර්ධන නිලධාරීන්ගෙන් සැදුම්ලත් පරීක්ෂණ කණ්ඩායමක් මාසිකව වරාය පරිශ්‍රයේ අධීක්‍ෂණ කටයුතු සිදු කරනු ලැබේ.

# THE PORT IS BECOMING A CLEAN AND GREEN PLACE

Recently, I got information from the BQ Operation's about an arrival of some unauthorized visitors at the port basin between BQ 04 and the passenger terminal. The time was around two thirty or three. We immediately reached the place and took several photographs and a short video clip of them.

Who were those unauthorized visitors?

Who permitted them?

How could they enter the port premises?

Can you think?

When we reached the place, there was a colony of Pelican birds. They were very free even in the high security area. At that moment, they were peregrinating in the area. It was a rare scenario in the port. The reason for it was that the port is a busier place than the any other place of the city. At that time there were many vessel movements in the area and number of other water crafts also was moving from place to place for their duties. However, those pelicans had been diving in an attractive moment within the area for a long time. At the same time, we could see the pelicans was not concerned about any other functions which occurred in the area. The pelicans were spreading their wings and fluttering them while enjoying themselves. It seemed as if they were up to relaxing after a long journey. Actually, it was a joyful scene for the port workers. They were looking at that rare scène. It could be seen for a long time.

What was the secret of this arrival? Was there any reason for this arrival? Yes, the pelicans are very keen on wandering in a clean environment. According to their routing, these birds follow the same way for their seasonal journey within their span of life. At this time, they had selected the port basin to have a little leisure while their long journey. The port is cleaner than the other areas of the sea line. At the same time, the pelicans like enjoying their food in a clean environment and it is the nature of these birds.





How can they treat Colombo port as a clean place? How could they justify it? It is due to either their sense or sight! However, they had come to a clean place. There was no waste oil on the surface of the port basin, there were no dumped garbage floating on the port basin, terminals were clean, and the spare land of within the port area was green. Therefore, their selection was perfect. They did not experience any disturbance before their presence in the port premises.

Through the visits of pelicans they have made a message about the port. What was the message created by them on the port? Have they created any positive message? Yes, there was a message to the port; "the port is clean", yes, it is true, if the port was not clean, the pelicans would not be eager to come to the port to spend their leisure time.

We could find out information to prove this message. The special delegation teams of maritime sector visited the port in last few months to admire the port beautification comparing to the other regional ports of South Asia.

I think those reflect are good recommendations for the program of "Clean and Green port concept of the port of Colombo".

Now I ask you. What do you think about this topic? Is the port clean? Yes. I can guess your response. The port is clean, not even the clean: Now it is green too.


The every premises of the Port is clean. Every plot of spare land is green. The port basin is clean. The surface of the port basin is not polluted by anyone. There are no waste oil patches, no garbage dumped, and no ballast water materials. All are following the rules of SLPA to protect the environment of the port sea area and the sky over the port and land. Because of this program, every sea creature is being safe in the port basin.


This objective is a great achievement of the Colombo port. The other noteworthy trait is, it was not an isolated task of SLPA, the CICT and the SAGT and the Ministry also have fully cooperated to make the program a success. Therefore it is a unique task. Also it was not an easy task for authorities who were concerned. Particularly, civil engineering, CSR, CPRD including other divisions, too were interested in this sphere. They had to initiate several programs to promote the "Clean and Green Port" concept among the port community. From time to time they organized several shrasmadana campaigns and launched many awareness programs to clean the port and the cleaning assignments were monitored by the civil sections. PHI and Medical sections continuously to update the program. Now, the effort has been succeseful. The Port has been identified and marked as a clean and a green place.

I think, we can create more opportunities in future to enhance the port income using this advantage. It will be a good path to attract tourists, Investors and ship owners more than today. They will be happy to come to a clean and green port. Specially, The Yatcht sailors also immensely like to approach clean and green ports.

At the end of this article, I wish to focus on a philosophical point. "All the living beings in the world are, somehow or other is interconnected for survival. They move in a circle to sustained life. In short they need each other. "What is the message of this thought? We must protect the environment. If we protect it, it will protect us. Then the world will be "Clean and Green".







Kawya Indrajith

තීර්ථ

# හෙළූ දහඩිය කඳුළු මුතු ඇට - ගෙවුණු තිස්අට වස පුරා එකතු කර අභිමන් පුදන්නෙමු - ඔබෙ දිරිය අගයනු නියා












### 38 වසරක වරාය අභිමානයෙන් පිදුම් ලැබූවෝ

ටී.එච්.ඩී.පී. ද සිල්වා මහතා -ප්‍රධාන කළමණාකරු (ආරක්‍ෂක), එස්.පී. අබේකෝන් මහතා -ප්‍රධාන අධිකාරී (ආරක්‍ෂක), කේ.ඒ.වයි. සෙනෙවිරත්න මහත්මිය -කළමණාකරු පරිපාලන (දක්‍ෂිණ වරාය සංවර්ධන), ඩබ්.ඩී. ධර්මසේන මහතා -ටග්යාත්‍රාපති (නාවික), එන්. ධර්මසිරි මහතා -වැඩ සහායක (සිවිල් ඉංජිනේරු), එෆ්.ආර්. වැලිගම මහතා -ගබඩා භාරකරු (සිවිල් ඉංජිනේරු), ඩබ්.ආර්. මනම්පේරි මහතා -සහකාර ගබඩා භාරකරු (ගුදම්) (සේවා සැපයුම්), එස්.එම්. ජයවීර මහතා -වැඩඅධීක්‍ෂක (ක්‍රියාකරවන), ජී.එච්. තිලකරත්න මහතා -සහකාර වැඩඅධීක්‍ෂක (ක්‍රියාකරවන) (ත්‍රි'මලේ වරාය), ජී.ඩී. ද සිල්වා මහතා -කවුළු තන්ඩර් (නාවික) (ගාල්ල වරාය) යන මහත්ම මහත්මීන් වෙත ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ත සේවක ප්‍රණාමය මෙලෙස 'තීර්ථ' අප පුද කර සිටින්නේ හෘදයාංගම සෙනෙහසිනි.

## මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනයෙන් බිංදු ජල සම්පාදන ක්‍රමය ඇරඹේ




තිරසාර පරිසරයක් තුළ ජාත්‍යන්තර මට්ටමේ සමුද්‍රීය පුහුණු පාඨමාලා සහ වරාය සේවක මහත්ම මහත්මීන්ගේ දෛනික රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය පුහුණු පහසුකම් සපයන මහපොල වරාය හා සමුද්‍රීය විද්‍යායතනය ස්වකීය ආයතන පරිශ්‍රයට හරිත පැහැයක් එක් කරමින් මහපොළ පරිශ්‍රය තුළ පැල සිටුවීමේ වැඩසටහනක් ක්‍රියාවට නැංවේ.

මේ සඳහා කාර්යාලයීය කටයුතු වලට යෝග්‍ය ප්‍රායෝගික ජල සැපයුම් ක්‍රියාවලියක් ක්‍රියාවට නැංවීම විශේෂිත කරුණකි. මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනයේ ප්‍රධාන පුහුණු කළමණාකරු නිර්මාල් ෆොන්සේකා මහතාගේ උපදෙස් මත බිංදු ජල තාක්‍ෂණය මෙහිදී ක්‍රියාවට නැංවේ. මෙහිදි Drippers තාක්‍ෂණය ඇසුරින් විසිරෙන ජල කාන්දු ක්‍රමය මහපොළ පරිශ්‍රය තුළ අද දවසේ එහි පිවිසෙන්නන් හට සොඳුරු හැඟුමක් ගෙනෙනු ඇත.




## සේවක පහසුව සඳහා ශාන්ත ජෝන් පදික දොරටුව විවෘත වේ

සේවක මහත්ම මහත්මීන්ගේ ඉල්ලීම පරිදි වරාය හා නාවික කටයුතු ගරු අමාත්‍ය මහින්ද සමරසිංහ මහතාගේ උපදෙස් මත ඉදිකරන ලද ශාන්ත ජෝන් දොරටුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උප සභාපති පී.ජී. දසනායක මහතා විසින් පසුගිය දා විවෘත කෙරිණි.

එම අවස්ථාව සඳහා අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක එල්.පී. සිල්වා, සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශයේ වැ.බ. ප්‍රධාන කළමණාකරු නලින් අපොන්සු, නියෝජ්‍ය ප්‍රධාන ආරක්‍ෂක කළමණාකරු ටී.එච්.පී පත්මසිරි ද සිල්වා යන මහත්වරුන් ද ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයේ (වරාය ශාඛාව) සභාපති ප්‍රසන්න කලුතරගේ මහතා ද ඇතුළු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිලධාරී මහත්ම මහත්මීන් සහ සේවක මහත්ම මහත්මීන් රැසක් ද මෙම අවස්ථාවට එක්වූහ.




# කේන්ද්‍රීය වරායක් (Mega Hub Port)

## ලෙස කොළඹ වරාය පිළිබඳ කියැවීමක්

කොළඹ වරාය දකුණු ආසියාවේ කේන්ද්‍රීය වරාය ලෙස පවත්වාගෙන යාම වරාය සේවක අප සැමගේ සිහිනයයි. ශ්‍රී ලංකාවේ නැව්ගත භාණ්ඩයන්ගෙන් 90% ක්ම මෙහෙයවනු ලබන්නේ කොළඹ වරාය කේන්ද්‍රීය කරගෙන වීම තුළ 2020 වන විට දේශිය බහලු ප්‍රවාහනය සහ ප්‍රති නැව්ගත කිරීම සඳහා ඉල්ලුම් අඛණ්ඩ ලෙසින් වර්ධනය වීම අපේක්ෂා කෙරේ. එම වැඩිවීම අඩි විස්ස සමාන ඒකක (TEĐ) මිලියන 10ක් වනු ඇතැයි මේ පිළිබඳ ක්ෂේත්‍රයේ ධීමතුන්ගේ අදහසයි.

එය දැනට පවතින තත්ත්වය මෙන් දෙගුණයක් සේ සැලකේ. මෙම තත්වය පිළිබඳ සැලකීමේ දී කොළඹ වරාය සතුව කේන්ද්‍රීය වරායක තත්ත්වය රැක ගැනීමේ ශක්‍යතාවයක් පවතී. ලෝකයේ පිහිටි කේන්ද්‍රීය වරායන් පිළිබඳ විමසීමේ දී කේන්ද්‍රීය වරායක තිබිය යුතු ලක්ෂණ ලෙස පහත සඳහන් කරුණු හැඳිනගත හැකිය.

1 නැව්බඩු වලට අදාල වැදගත් ස්ථානයක පිහිටා තිබීම.

2 නාවික මාර්ගවලට ලංව පිහිටා තිබීම.

3 පර්යන්ත පහසුකම් දීර්ඝ කිරීමේ හැකියාව.

4 බහලු මෙහෙයුම් කටයුතු කාර්‍යක්ෂම ලෙස කිරීමේ හැකියාව

5 සුදුසු භූගෝලීය සීමාවන් තුළ නිරන්තර පෝෂණ සේවා සැපයීමට ඇති හැකියාව.

6 විකල්ප පර්යන්ත මෙහෙයුම් ගාස්තු

මෙම කරුණු කාරණා සලකා බැලීමේ දී කොළඹ වරාය දකුණු ආසියාවේ කේන්ද්‍රීය වරායක් ලෙස වර්ග කිරීමට ඇති ලක්ෂණ ප්‍රශස්ත මට්ටමේ පවතී. එහෙත් කොළඹ වරායේ සම්පූර්ණ නැව් භාණ්ඩවලින් 50%ක්ද ප්‍රති නැව්ගත භාණ්ඩවලින් 80% ක්ද ඉන්දියානු කලාපයේ භාණ්ඩ වීම සැලකිල්ලට ගත යුතු කරුණකි. දැනට ඉන්දියානු කලාපීය වරායන් මත යැපෙන තත්වය අඩු කිරීම සඳහා ඉන්දියාවේ නාවික යටිතල පහසුකම් පුළුල් කිරීමේ දැවැන්ත ක්‍රියාවලියක නිරත වී සිටින වගද පහසුවෙන් අමතක කළ නොහැකිය. ඉන්දියානු දකුණු වරායක් ලෙස සැලකෙන වල්ලර් පඩම් වරාය ඩුබායි පෝර්ට්ම් ඉන්ටර් නැෂනල් සමග ඒකාබද්ධව සංවර්ධනය කිරීම අවසන් වෙමින් පවතින බැවින් කොළඹ වරාය මුහුණ දී ඇති තත්ත්වය පහසුවෙන් ලඝු කොට සැලකිය නොහැක.

එහෙත් කොළඹ වරාය සතු සුවිශේෂී භූගෝලීය පිහිටීමේ වාසිය පදනම් කරගෙන, ඉන්දියානු අර්ධද්වීපයේ ඇති සියලු වරායයන්ට වඩා ඉතා වාසිදායක තත්ත්වයක් පෙන්නුම් කරන කොළඹ වරාය, වරාය පෝෂණ කටයුතු සැලයීම සම්බන්ධයෙන් ලාභදායීම වරාය ලෙස සැලකිය හැකිය. මෙම වාතාවරණය තුළ ඉන්දියානු වල්ලර්පඩම් හෝ විසින්ජම් වරායයන් වලින් තර්ජනයක් නොඑතැයි එකවරම බැහැර කළ නොහැක. එහෙත්, ඒ තුළින් දිවෙන රතු සංඥා අප විසින් හැඳිනගත යුතුය. ඉන්දියාව 2020 වන විට අඩි විස්ස සහ ඒකක මිලියන 15 දක්වා වැඩි කිරීමට සැළසුම්කර ඇත. මේ අනුව විදේශිය කේන්ද්‍රීය වරායයන් වෙත යැපීමෙන් ඉන්දියාව ඉවත්වීමට උත්සාහ ගනු ඇත. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් මත අත්හිටුවා ඇති එහෙත් අත්හැර දමා නැති සේතු සමුද්‍රම් වාසි අවාසී කෙරෙහිද මෙහිදී අවධානයට ලක්විය යුතුය. යම් හෙයකින් එය ක්‍රියාත්මක වුවහොත් කොළඹ වරායේ බහලු පර්යන්තයන් වෙත ඉන්දියානු වරායයන්ගෙන් ලැබෙන පෝෂක සේවාවන් පිළිබඳ ප්‍රශ්නාර්ථයක් ඉතිරිවනු ඇත. එමෙන්ම, තායිලන්තය ක්‍රා ඇල මාර්ගය හේතුවෙන් කොළඹ වරායට අත්වන වාසි

ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් මත අත්හිටුවා ඇති එහෙත් අත්හැර දමා නැති සේතු සමුද්‍රම් වාසි අවාසී කෙරෙහිද මෙහිදී අවධානයට ලක්විය යුතුය. යම් හෙයකින් එය ක්‍රියාත්මක වුවහොත් කොළඹ වරායේ බහලු පර්යන්තයන් වෙත ඉන්දියානු වරායයන්ගෙන් ලැබෙන පෝෂක සේවාවන් පිළිබඳ ප්‍රශ්නාර්ථයක් ඉතිරිවනු ඇත.

පිළිබඳව මෙහිදී සැලකිල්ලට ගත යුතුය.

නැව් සමාගම් පිළිබඳ විමසීමේදී නැව් සමාගම් වැඩි වශයෙන් ස්වකීය අවධානය යොමු කරනුයේ වරායේ ඇති ත්ත්වයට වඩා ඒ හා සම්බන්ධ වී ඇති සේවා සැපයීම් තත්ත්වය කෙරෙහිය. සංවර්ධිත රොඩෑම් සහ අන්ට්වර්ඩ් වරායවල සාර්ථකත්වය රැක ගැනීම සඳහා වරාය ආශ්‍රිත කර්මාන්ත, රට අභ්‍යන්තරව ඇති බහලු මධ්‍යස්ථාන හා වටිනාකම් එකතුවන සේවාවන් වරාය සංවර්ධන කටයුතුවලට ඇතුළත් කර තිබේ. අන්ට්වර්ඩ් වරාය සංවර්ධනයේ දී සමුද්‍රාසන්න කර්මාන්ත සංවර්ධන ප්‍රදේශයන් ද ඇතුළත් කර ඇත. ඇන්ට්වර්ඩ් වරාය සංවර්ධන කටයුතුවලදී වරාය කටයුතු මෙහෙයවන්නට සේවාවන් සැපයීමයට ද අවස්ථාව ලබා දී ඇත. ජපානයේ වරාය සංවර්ධන කටයුතුවලදී වරායට සම්බන්ධ බෙදා හැරීම් මධ්‍යස්ථානයක් ද ඇතිකර ඇත. මෙම බෙදා හැරීමේ මධ්‍යස්ථාන වලට දේශිය මෙන්ම විදේශීය ගනුදෙනුකරුවන්ගෙන් භාණ්ඩ එකතුකර ඇණවුම් ලැබී ඇති අන්දමට මහාමාර්ග හරහා බෙදා හරිනු ලැබේ. ඒ තුළින් වරාය ආශ්‍රිත නගරවල සැහැල්ලු කර්මාන්ත සංවර්ධනයක් ද ඇතිවනු ඇත.

වරාය සංවර්ධනයේ දී ගොඩ දෙසට මෙන්ම මුහුද දෙසට ද සංවර්ධන කටයුතු සමගාමීව මෙහෙයවීම සිදු කළ යුතුය. නැව් ඇතුළට ගැනීම හා පිටත්කර හැරීම සඳහා අවශ්‍ය පරිදි පරිශ්‍රයන් සංවර්ධනය වීම විය යුතුය. ගොඩ දෙසට සංවර්ධනයට ඇතුළත් වනුයේ නැව් ආකර්ශනය කර ගැනීමට අවශ්‍ය ගොඩබිම් සේවාවන් සංවර්ධනය කිරීමය. මෙයට වරාය තුළ හා වරායෙන් පිටත කටයුතු ද ඇතුළත් වේ. මේ අනුව කේන්ද්‍රීය වරායක් සාර්ථක වීමට එයට ඇතුළත් ඉඩම් ප්‍රමාණයක් තිබිය යුතුය. මේ අනුව කේන්ද්‍රීය වරායක් ආශ්‍රිතව ඇති ඉඩකඩම් ඇති තරගකාරීත්වය එම වරායේ භෞතික සැළසුම්ලට බලපානු ඇත. එහෙත්, කේන්ද්‍රීය වාණිජ වරායයන් සංවර්ධනය කිරීමේ දී ඉඩම් ද ඊට ඇතුළත් කිරීම නාගරික සංවර්ධනය සැලැස්මක නිත්‍ය ලෙසින්ම තිබිය යුතුය.

**සටහන -උපුල් ගුරුගේ**



# 38 වසරක











කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය කිසිදු පාර්ශවයකට ලබා දෙන්නේ නැතැයි තමන් ස්ථිර වශයෙන්ම ප්‍රකාශ කරන බව ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා ප්‍රකාශ කළේ ය.

හම්බන්තොට වරායේ විදේශ ණය ගෙවීම නොතිබුණා නම් මේ වන විට කොළඹ වරාය මීට වඩා කොපමණ දියුණු දැයි ප්‍රශ්න කළ ජනාධිපතිවරයා හම්බන්තොට වරායේ ණය ගෙවීමත් සමග කොළඹ වරාය බරපතල ආර්ථික අර්බුදයකට ලක්ව තිබුණු නමුත්, වර්තමානයේ ඒ තත්ත්වයෙන් කොළඹ වරාය නිදහස් වී ඇති බව ද සඳහන් කළේ ය.

ජනාධිපතිවරයා මේ බව පැවසුවේ කොළඹ වරාය නැගෙනහිර පර්යන්ත පරිශ්‍රයේ දී පැවති වරාය අධිකාරියේ 38 වැනි සංවත්සර උත්සවයේ දී ය. සම්බුද්ධ චෛත්‍ය පරිශ්‍රයේ දී පවත්වනු ලබන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ චිරාගත සම්ප්‍රදානුකූල සර්වාගමික වතාවත්වලින් අනතුරුව පැවති මෙම උත්සවයේ දී ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා මෙසේ පැවසීය.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වසර 38 ක ගමන්මග ගැන මා සතුටු වෙනවා. අපි මුහුදින් වටවූ දූපතක් විදියට කල්පනා කරනකොට ඉතිහාසයේ මතක සටහන් රාශියක් සිහියට නැගෙනවා. අද අපේ වරාය ලෝකයේ තාක්ෂණය සහිත සියලු වරායයන් සමග කරට කර තරග වදින තැනක සිටිනවා. වරාය රට වෙනුවෙන් ඉතා ඉහළ සේවාවක් කරනවා. අපේ රට ලෝකයා හඳුනාගන්නේ මූලික වශයෙන් වරායන් නිසයි. මේ හා සම්බන්ධ අවුරුදු හාරසියයක පන්සියයක ඉතිහාසයක් අපට කතා කරන්න පුලුවන්. නාවික ගමනාගමනය විදේශ ආක්‍රමණ යනාදි කරුනු ගැන ලෝකය සමග තරගකාරීත්වයට පදනම වැටුණේ ද වරායයන් නිසයි. එදා මෙදා තුර සේවය කළ සියලු සේවකයන්ගේ ගුණ සිහිපත් කිරීම ඔවුන් මතක් කිරීම මෙහි දී ඉතා වැදගත්. කළගුණ දත් ජාතියක් වශයෙන් අප එය කළ යුතුයි.

වරායෙන් රටේ ආර්ථිකයට ලැබෙන්නේ ලොකු ශක්තියක්. එදා මෙදා තුර සේවකයන්ගේ මෙය මනාව ගොඩ නැගුණා. වර්තමානයට මග පෙන්වන්නේ අතීතයයි. අප ඒ වර්තමානය ශක්තිමක් කරමින් අනාගතයට මුහුණ දිය යුතුයි.











# කොළොම්තොට අභිමානය










> එක් දහස් නවසිය හැත්තෑ නවයේ දී මේ වරාය තිබු තැන මොකක්ද? ඒ අතරේ සිදු වූ වෙනස්කම් අප දන්නවා. මීට වසර 38 කට පෙර තිබු තත්ත්වයට වඩා අද තත්ත්වය වෙනස්. මේ වෙනස තුළ අප දකින්නේ විශාල සංවර්ධනයක්. 38 වසරක් ඒ කළ සේවය මා ඉහළින්ම අගය කරනවා. මම ඔබලාට සුභ පතනවා. ඔබ සැමගේ බුද්ධියේ දනුම වර්ධනය වේවායි ප්‍රාර්ථනා කරනවා.


එක් දහස් නවසිය හැත්තෑ නවයේ දී මේ වරාය තිබු තැන මොකක්ද? ඒ අතරේ සිදු වූ වෙනස්කම් අප දන්නවා. මීට වසර 38 කට පෙර තිබු තත්ත්වයට වඩා අද තත්ත්වය වෙනස්. මේ වෙනස තුළ අප දකින්නේ විශාල සංවර්ධනයක්. 38 වසරක් ඒ කළ සේවය මා ඉහළින්ම අගය කරනවා. මම ඔබලාට සුභ පතනවා. ඔබ සැමගේ බුද්ධියේ දනුම වර්ධනය වේවායි ප්‍රාර්ථනා කරනවා.

මෙහිදි අදහස් දක්වූ වරාය හා නාවික අමාත්‍ය මහින්ද සමරසිංහ මහතා

''38 වන සංවත්සරය සමරන අද දවස අපට සුවිශේෂි දවසක්. පසුගියදා අපි හම්බන්තොට වරාය බදු ගිවිසුම අත්සන් කළා. අප හම්බන්තොට ණය බර අවසන් කර මිලියන 9100ක් රටට ඉතිරි කර ගත්තා. මේ මුදල හරහා වරාය සේවකයන්ගේ සුරක්ෂිතතාව තහවුරු කරන්න පුළුවන්. වරාය හයේම (6) සංවර්ධන කටයුතු කඩිනමින් කරන්න විශාල මූල්‍ය සම්පතක් අද අපට තියෙනවා.

වරාය ගිවිසුම අත්සන් කරන්නට කලින් ජනාධිපතිතුමා මට අවවාද කිහිපයක් කළා. එක බිම් අඟලක්වත් පිටරටට විකුණන්න එපා කිව්වා. ජනාධිපතිතුමා වරාය සින්නක්කරව දෙන්න කැමති වුණේ නැහැ. අපි ජනාධිපතිතුමාගේ නියෝග පිළි පැද්දා. මේක බදුදීමක් පමණයි.

මෙහිදී අදහස් දක්වූ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා

වරාය අධිකාරිය අවුරුදු 38ක් පුරා රටේ ආර්ථිකය කළ මෙහෙවර සුළුපටු නැහැ. මෙය දකුණු ආසියාවේ ප්‍රමුඛතම නාවික කේන්ද්‍රස්ථානය කිරීම අපේ අරමුණයි. අපි ඒ සඳහා තුන් අවුරුදු සැළැස්මක් ක්‍රියාත්මක කරනවා. අද වන විට කොළඹ වරායට බහලු මෙහෙයුම් අතින් ලෝකයේ 23 වැනි තැන හිමි වී තිබෙනවා. හෙට දවසේ එය තවත් ඉදිරියට ගෙන යාමට අපි කටයුතු කරනවා. ඒ සඳහා වරාය අධිකාරියේ සියලු සේවක මහත්ම මහත්මීන් ලබා දෙන දායකත්වය මා විශේෂයෙන් අගය කරනවා.

ප්‍රසාංගික අංග රැසකින් සමන්විත මෙම විචිත්‍ර උත්සව අවස්ථාවට ඇමතිවරුන් වන ගයන්ත කරුණාතිලක, ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා, ජෝන් අමරතුංග, ඒ.එච්.එම්.ෆවුසි, වරාය හා නාවික නියෝජ්‍ය අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම, නාවික හමුදාපති වයිස් අද්මිරාල් රවීන්ද්‍ර විජේගුණරත්න යන මහත්වරුන් ද විදේශීය තානාපතිවරු ඇතුළු දූත පිරිස් හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමණාකාරීත්වය ප්‍රමුඛ සේවක මහත්ම මහත්මී රැසක් සහභාගී වූහ.

**සටහන**
**උපුල් ගුරුගේ**
















## කොළඹ වරායට මගී නෞකා ආකර්ෂණය දැඩිවේ







සමුද්‍රීය කලාපයේ තරගකාරී  වරායක් ලෙසට කොළඹ වරාය යන ගමනට සුවිශේෂී අත්වැලක් සපයමින්  කොළඹ වරාය ලෝකය පුරා සංචාරයේ යෙදෙන මගී නෞකාවන්ගේ ආකර්ෂණය දිනාගෙන ඇත.

2017 ජනවාරි මස සිට අගෝස්තු 31 දක්වා කාලය තුළ කොළඹ වරාය වෙත මගී නෞකා 43 ක් පැමිණීමෙන් ඒ බැව් තහවුරු වේ.

ඉතාලි ධජය යටතේ යාත්‍රා කරන දිගින් මීටර් 220ක් වූ ධාරිතාවය ටොන් 26445 ක් වූ Casta  Neo Classica නෞකාව ජනවාරි මස 02 වැනි දින කොළඹ වරායට සේන්දු වි ය. එය 2017 වසරේ කොළඹ වරායට පැමිණි ප්‍රථම නෞකාව ලෙසින් සැලකේ.


මෝල්ටා ධජය යටතේ යාත්‍රා කරන Celebrity Constelletion නෞකාව කොචින් වරායේ සිට ජනවාරි මස 17 වැනි දින කොළඹ වරායට සේන්දු විය. දිගින් මීටර් 294 කින් හා උසින් මිටර් 8.25 කින් යුතු මෙම නෞකාවේ ධාරිතාවය ටොන් 53635කි.

මාර්ෂල් අයිලන්ඩ් ධජය යටතේ යාත්‍රා කරන Nautica නෞකාව දිගින් මීටර් 181 කින් යුතුවන අතර උසින් මීටර් 5.70 කින් සහ ටොන් 11481 ක ධාරිතාවයකින් යුතුය.

Aurora, Silver Discovery, Costa neoclassia, Amsterdam, Norwegian star, Island sky, Seven Seas Navigutor, costa Neoromantioa Black watch, Main Schiff 1, Casta Luminosa, silver whisper, Island sky Arcadia, queen Elizabeth, Seabourn Encore, Celebrity Consterlation Magalan, Artanir, Queen mary  - 02, Azamara Joorney Europa 02, ocean Dreem, Sea Princess ආදි නෞකා මේ අතර ප්‍රධාන වේ. 2017 අප්‍රේල් 04 වැනි දින සිය ප්‍රථම සංචාරය ආරම්භ කළ Majestic Princess නෞකාව 2017 ජුනි 12 වැනි දින කොළඹ වරායට සිය ප්‍රථම ගමන සනිටුහන් කරන ලදි. ඒ වෙනුවෙන් වූ සමරු ඵලක හුවමාරුව  ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා හා නෞකා කපිතාන් ක්රෙයින් ස්ටේවාට් ස්ට්‍රීව් යන මහත්වරුන් අතර නෞකාවේ දී සිදුවිය. රෝයල් ප්‍රින්සස් හා රීගල් ප්‍රින්සස් නෞකාවේ සොයුරි නෞකා ලෙසින් සැලකේ.

මෙම නෞකාවේ 3560 ක සංචාරකයින් ප්‍රමාණයක් සඳහා පහසුකම් ඇති අතර 1346 ක කාර්ය මණ්ඩලයකින් යුතුවේ. මෙහි දිග අඩි 1083 කි. අඩි 224 ක් උසකින් හා පළල අඩි 126  කින් යුතුය.  මෙම අවස්ථාවේ අදහස් ප්‍රකාශ කරන ආචාර්ය පරාක්‍රම දිසානායක මහතා නෞකාවක් පැමිණීම රටට ආර්ථික වාසියක් ම පමණක් නොවන අතර එය නව රැකියා අවස්ථා බහුල වීමට ද හේතුවක් වන බව ප්‍රකාශ කළේ ය.

## ජීවිතය විනිවිදින දහම් දෙසුමක්




''මහරහතුන් වැඩි මග ඔස්සේ..'' නමින් ජාතික පුවත්පතක පල වූ ධර්ම සාකච්ඡා මාලාව තුළින් ආගමික සන්නිවේදනයේ නිම් වලලු පුළුල් කළ අතිපූජ්‍ය රාජගිරියේ ආරියඥාන ස්වාමින් වහන්සේ විසින් වරාය සම්බුද්ධ ජයන්ති චෛත්‍ය පරිශ්‍රයේ දී පවත්වනු ලද ධර්ම දේශනාව කොළඹ වරායේ බොදු බැතිමතුන්ගේ ධර්ම සංවේගයට හේතු විය.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බෞද්ධ සංගමයේ සංවිධායකත්වයෙන් හා සේවක මහත්ම මහත්මින්ගේ බැතිබර දායකත්වයෙන් පැවති මෙම ධර්ම දානයේ දී බැතිමතුන් අමතා දේශනා කළ දහම් කරුණක් මෙලෙස සටහන් කරමි.

''තමා තමාට මෛත්‍රී කළා කියන්නේ ලෝකයාට මෛත්‍රී කළා කියන්නේ දස දිසාවට මෛත්‍රී පැතිරුවා.. කියන්නේ මම සුවපත් වෙම්වා නිදුක් වෙම්වා.. නීරෝගී වෙම්වා... දස දිසාවෙම සත්වයෝ සුවපත් වෙත්වා... කියල නම් නොවේ. තමා මේ සංසාර භය දැකලා මේ ජීවිතයේ සතර අපායෙන් මිදෙනවා කියන කාරනය මතු කරලා ගන්න. හිතින් එය මතුකරල ගනිද්දි අපි දකින්න ඕන අපි විදර්ශනාවට යොමු වෙනව නම් භාවනාවට යොමු වෙනව නම් අපට දවසේ පැය විසි හතරෙන් පැයක් භාවනා කරලා මේ ප්‍රශ්නෙ විසදන්න බැහැ. දවසේ පැය විසි හතරෙන් පැයක් අනිත්‍ය සංඥාව වඩලා පැය 23 ක් නිත්‍යා සංඥාව වඩන්නේ නම් කවදාවත් මේ දෙක සමබර වෙන්නේ නෑ.''

## වරාය සේවක විශ්‍රාම ගැන්වීමේ වයස අවු. 60 දක්වා දීර්ඝ කෙරේ

වරාය අධිකාරියේ සේවක මහත්ම මහත්මීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු (60) හැට දක්වා දීර්ඝ කරන ලෙස සේවක මහත්ම මහත්මීන් විසින් කරනු ලබන ඉල්ලීම් සැලකිල්ලට ගෙන 2017.08.01 දින සිට ඉදිරියට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක මහත්ම මහත්මීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු හැට (60) දක්වා දීර්ඝ කිරීමට කළමණාකාරීත්වය පියවර ගෙන ඇත.

2017.08.01 දින සිට ඉදිරියට ක්‍රියාත්මක වන පරිදි සේවක මහත්ම මහත්මීන් විශ්‍රාම ගැන්වීමේ වයස 60 ලෙස සංශෝධනය කරන අතර, 2017.08.01 දිනට සේවයේ නියුතු සේවක මහත්ම මහත්මීන් සඳහා පමණක් මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදන අදාල වනු ඇත.

## නැණ මල් පුබුදු කළ සිසු නැණ මිටියාවත...





ශ්‍රී ලංකා වරාය අධිකාරිය ආයතනික සමාජීය වගකීම් ප්‍රධානී උපෙන්ද්‍ර සිල්වා මහතාගේ මෙහෙයවීමෙන්, සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය මගින් සංවිධානය කළ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය පෙරහුරු සම්මන්ත්‍රණයක් පසුගියදා වරාය අධිකාරියට අයත් මහපොළ සමුද්‍රීය විද්‍යායතනයේ දී පැවැත් විණි.

වරාය අධිකාරියේ සේවයේ නියුතු වූවන්ගේ 2017 අගෝස්තු ශිෂ්‍යත්ව විභාගයට මුහුණ දෙන දරු දැරියන් වෙනුවෙන් පවත්වන ලද මෙම සම්මන්ත්‍රණයට විශාල දූ දරුවන් පිරිසක් සහභාගි වූහ. මෙම වැඩසටහනට  අනුග්‍රහය දක්වා ඇත්තේ ජාතික ඉතිරිකිරීමේ බැංකුවයි.




දෙවැනි ලෝක යුද්ධයෙන් පසුව එංගලන්තයේ ආර්ථික අවශ්‍යතා උග්‍ර වුණා. එක් එක් ජනපද වල විවිධ ගැටළු වලට මුහුණ පාන්නට සිදුවුණා. මෙයට පිළියම් සෙවූ රෝස් ඩෙල් සහෝදරයන් දෙදෙනා 1844 වසරේ දී එකතුවෙලා සමූපකාරය සංකල්පය ක්‍රියාවට නැංවූවා. සාගින්නෙන් පෙළුණු ජන හදවත්වලට සමූපකාර ක්‍රමය යෝධ සිහිලසක් වුණා.

1906 ලංකාවේ දුම්බර මිටියාවතේ ණය දෙන සමූපකාර සමිතියක් ආරම්භ වුණේ ආර්ථික පීඩාවෙන් හෙම්බත් වුණු අපේම පිරිසකට හයියක් වීමේ අරමුණෙනුයි. 1911 සමූපකාර සංවර්ධන පනත ස්ථාපිත වීමත් සමඟ රට පුරා සමූපකාර ඇරඹුණා. සමූපකාර ණය දෙන සමිති ශාඛා ගමින් ගම ඇරඹුණා. කොළඹ වරායෙත් 1985 අවුරුද්දේ සේවක සමූපකාර බැංකුවක් ස්ථාපිත වුණා. එදා පටන් වරාය අධිකාරියේ සේවක සමූපකාරය සේවක මහත්ම මහත්මීන්ගේ ආයෝජනයට













ශක්තිමත් පවුරක් වෙමින් සේවක සමූපකාර බැංකුව ආ ගමන් මග විස්මිත ය.

හෙට පිපෙන කොඳ මල් කැකුළු බඳු දූයේ දූ පුතුන් හට ශිෂ්‍යත්ව ප්‍රදානය කරමින් ඔවුන්ගේ අධ්‍යාපන ජීවිතයට ශක්තියක් වීමම එම ක්‍රියාදාමයේ ශක්තිය විදහා දක්වයි.

මෙවර ද නව රඟහල අතුරු සිදුරු නැතිව පිරී ගියේ 2016 සරසවි වරම් ලද දූ දරුවන්ගෙන් හා ඔවුන්ගේ දෙමාපියන්ගෙනි.

මේ අවස්ථාවට සමූපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් ඩී. ජීවානන්දන්, ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති හා ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික කේ.ඩී.ලාල්කාන්ත, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන පරිපාලන කළමණාකරු ආර්.එම්.ජේ.එස්.රත්නායක මහතා සේවක සමූපකාර බැංකුවේ සාමාන්‍යාධිකාරී උපුල් ප්‍රසංග, උප සභාපති එස්.එස්.ටී.මැදවත්ත මහතා ඇතුළු නිලධාරීන් රැසක් සහභාගී විය.

සරසවි වරම් ලද දූ දරුවන් ශිෂ්‍යත්ව ප්‍රදානය පිළිබඳ දක්වූ අදහස්

**තාරිකා හේවගේ - බත්තරමුල්ල**

''මේක ඇත්තටම හොඳ දෙයක්, මේ තුළින් අපි වැනි පිරිස් දිරිමත් කරනවා. විශ්ව විද්‍යාල ජීවිතය සාර්ථක කර ගන්නට සමූපකාර බැංකුව විසින් අපහට ලබාදෙන ශිෂ්‍යත්වයට බොහෝම ස්තුති වන්ත වෙනවා. මං හිතන්නේ මේක සමස්ථ අනාගත පරපුරට කරන ආයෝජනයක් කියලා. ඉංජිනේරු කොට්ඨාශයේ සේවය කරන මගේ පියා වන ජයන්ත හේවගේ මහතාවත් මං ආදරෙන් සිහිපත් කරනවා.''

**සමේලි සෙනෙවිරත්න - මොරටුව**

''දහසක් බලාපොරොත්තු හිතේ තියන් උසස් පෙළ විභාගය සමත්වීම විශාල ජයග්‍රහණයක්. ඒ ජයග්‍රහණයට අපිට අත දෙන්න සේවක සමූපකාර බැංකුව ඉදිරිපත් වීම පිළිබඳ ගෞරවණීය හැඟිමත් මා තුළ තිබෙනවා. නිදහස් අධ්‍යාපනයෙන් උපරිම ඵල නෙලාගෙන රටට සේවය කිරීමට බලාපොරොත්තු වෙනවා.''

**සිතාරා අන්වර්තාන්**

''මේ ශිෂ්‍යත්ව හිමිවීම පිළිබඳ ඇත්තටම සතුටු වෙනවා. මෙවැනි වැඩසටහන් පවත්වාගෙන යාම ඉතාම කාලෝචිතයි. ඒ සඳහා මහන්සි වන සියලුම නිලධාරි මහත්ම මහත්මීන්ට මගේ ප්‍රණාමය පුදකර සිටිමි.''

**ආර්.කේ.එස්.එම්.රණසිංහ - ගම්පහ**

'' මගේ තාත්තා ජයබහලු පර්යන්තයේ සේවය කරන්නේ. මට මුලින්ම මගේ තාත්තට ණය ගැතියි. එතුමා නිසයි මට මේ අවස්ථාව උදාවෙන්නේ. බණ්ඩාරනායක විද්‍යාලයේ අකුරු කරපු මාව යාපනය විශ්ව විද්‍යාලයට තේරී තිබෙනවා. ඒ සතුට දෙගුණ තෙගුණ වෙනවා මේ ශිෂ්‍යත්වය නිසා.''

**ආර්.කේ.පසන් මලිත් - කොටහේන**

''විශ්ව විද්‍යාලයට තේරෙන සිසුවෙකුට බොහෝ වියදම් යන බව මා අසා තිබෙනවා. ඉතින් එවැනි මොහොතක මෙවැනි ශිෂ්‍යත්වයක් ලැබීම පිළිබඳ බොහෝම සංතෝෂ වෙනවා. මගේ තාත්තා ආර්.කේ. ප්‍රියන්ත, වැඩ කරන්නේ විදුලි කාර්මික ශිල්පියෙකු හැටියටයි.''

**තුෂාන් මපාගෙදර - නාවලපිටිය**

නැව් ශිල්පි ඩී.ජේ.මාපාගෙදර මගේ තාත්තා. එතුමා සේවය කරන ආයතනයෙන් මෙවැනි අවස්ථාවක් උදාකරදීම පිළිබඳ මං බොහෝම තෘප්තිමත්. හෙට දවසේ අනාගතය බාර ගන්නට බලාපොරොත්තුවෙන් සිටිනා අපිට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමූපකාර බැංකුව අපිව අගය කිරීම පිළිබඳ නිහතමානී සතුටක් මම විඳිනවා.''

**එච්.කේ.දනුෂ්ක සම්පත් - මාතර**

මගේ තාත්තා ජයබහලු අංශයේ සේවය කරන විමල් ශාන්ත. තාත්තා සේවය කරන තැන අපිටත් තැනක් තියෙනවා කියන හැඟීම හිතට නිහතමානී සතුටක් ගෙන එනවා.''

**එම්.ඩී.අයි.ඒ.වික්‍රමසිංහ**

''තව අවුරුදු -5 කින් වෛද්‍යවරියක් වී දූය සුවපත් කිරීම මාගේ බලාපොරොත්තුවයි. ඒ බලාපොරොත්තුව සේවක සමූපකාර බැංකුවෙන් ලැබුණු දිරිය මුසු සහයෝගය බොහෝම වැදගත්.''

**සටහන -උපුල් ගුරුගේ**



තීර්ථ

# වේදිකාවෙන් ලැබූ පන්නරය මට මහමෙරක්

**ඉන්ද්‍රසිරි රත්නායක**

කලාව සිය ජන්ම දායාදය කරගත් ඔහු පාසල් වේදිකාව තුළ තම කලා කුසලතාවය මනා ලෙස ඔප් නංවා ගත්තතේය. 1976 වසර් දී රත්මලාන ද සොයිසා මහ විදුහලේ රඟමඩලේ නාට්‍ය කිහිපයක්ම රංග ගත කළ ඔහු පියවරෙන් පියවර ඉදිරියට පා ඔසවන්නේ කලා සංස්කෘතික හා සමාජීය නම් වූ සොඳුරු කලාකරුවාගේ නිර්මාන දායකත්වය පිළිබඳ සංලාපයේ යෙදෙන්නටෙ මෙවර රඟමඬල වෙන් වේ.

## ඔබේ ප්‍රථම වේදික නිර්මාන්‍ය පිළිබඳ සිහිපත් කරමු...

රොන් සිඳුන මලක් මගේ ප්‍රථම වේදිකා නාට්‍යයි. කාන්ති, ෆොන්සේකා, කාන්ති ලතා ප්‍රනාන්දු, හේමසිරි හල්පිට, ප්‍රේමත්න ලියනගේ ආදී ශිල්පීන් රැසක් එහි රංගනයට දායක වුණා. ඊට අමතරව ආදිපාද, දොංත බබක්කා, යථාර්ථ, පට්ටම් නැති රෝද, මන්ත්‍රි, ක්‍රිස්තුනි මට සමාවෙන්න, ආදි වේදිකා නිර්මාණයන්ට දායක වුණා.

## වේදිකාවෙන් ඔබ සිනමාවට ප්‍රවේශ වෙනවා...

ඔව්, එය මට සුවිශේෂි අවස්ථාවක්. 1979 වසරේ මද්දුම බණ්ඩාර චිත්‍රපටියේ රංගනයට එක්වීමෙන් සිනමාවට සම්බන්ද වෙන්නට අවස්ථාව සැලසුණා. සිනමා ක්ෂේත්‍රයේ දී ප්‍රවීණ රංගන ශිල්පි ෆෙඩි සිල්වා ශූරීන්ගේ ඇසුර ලබන්නය හැකි වුණා. ඒ තුළින් චිත්‍රපට රාශියකට රංගනයෙන් දායක වන්නට වාසනාව උදාවුණා. ඒ අතර තදීරා, අලිබබා සහ හොරු හතලිහ, ඔක්කොම හොඳටයි, සඳරේකා, පුදුමයි ඒත් ඇත්තයි, ලඟින් ගියත් ඇහැක් නැහැ, කාටද ආඩම්බර ආදිය නිර්මාණ විශේෂයි.



## දායක වූ ටෙලි නාට්‍ය...

මං රංගනයෙන් දායක වූ ටෙලි නිර්මාණ අතර ''වසුදා, මායම්, පාන් බට්ටා, තරු පතන ආදි නිර්මාණ මේ මොහොත් මගේ මතකයට නැගෙනවා.

## ඔබ ප්‍රසංග වේදිකාවත් ජය ගන්නවා....

කුඩා කාලයේ පටන්ම ගීත ගායකයටත් විශේෂ හැකියාවක් තිබුණා. කොළඹ මුහුන්දිරම් නමින් ගීත කැසට්පටයක් එළි දක්වන්නටත් හැකිවුණා. ඊට පස්සේ ප්‍රසංග වේදිකාවේ දී ෆෙඩි සිල්වා ශිල්පියා ගැයු ගීත ගායනයටත් අවස්ථාව උදාවුණා.

නිර්මාණකරණය වෙනුවෙන් සිදුකළ මෙහෙවර වෙනුවෙන් සම්මානයටත් පාත්‍ර වුණා. සම්මාන මට හිමිවුණ. තව දුරටත් නිර්මාණ කාරණයේ යෙදෙමින් ආදරණීය රසිකයින් පිනවීමටයි මගේ බලාපොරොත්තුව. ඒකට වරාය අධිකාරියයෙන් ලැබෙන ශක්තිය හරිම අගෙයි.

**- ගුරු -**



# නිවේදන වෘත්තිය මගේ ජීවිතයයි

**සජිත් අලංකාර**

**ජාතික රූපවාහිනියේ සැම පෝදා දිනකම ආගමික සන්නිවේදනයෙන් ඇසු පිරු වැඩසටහන් සමග හදවතට මෙන්ම බුද්ධියට ද එකසේ අමතන පූරක භූමිකාවන් අතර පෙරමුණේ සිටිනා චරිතයක් ලෙස අද දවසේ රඟමඩලට ගොඩවදින කතා නායකයා හඳුන්වා දෙන්න පිළිවන්. සැබෑ සන්නිවේදන ක්‍රියාවලියක සුභ සිහිනයක පෙර ගමන්කරු වීමේ නොතිත් දූක්මෙන් පසුවන ඔහු සජිත් අලංකාරය.**



### ඔබ ආගමික සන්නිවේදනයට සුවිශේෂිතාවයක් දක්වන්නේ ඇයි..?

මං හිතන්නේ එය මට ලැබුණු සුවිසල් භාග්‍යයක්. කුඩා කාලයේ සිට ආගමික වැඩසටහන් වලට පැවති නැඹුරුව මේ කටයුත්තට මා මෙහෙයූවා කියන්න පුලුවන්. දහම් පාසලෙන්, මගේ පාසලෙන් ලැබුණු පන්නරය, ආභාෂය මේ තුළ කැටි වී තිබෙනවා. මං නිරතුරුවම විශිෂ්ඨ සන්නිවේදකයන්ගේ ආභාෂය හා ගුරුහරුකම් ලබන කෙනෙක්. ඒ වගේම ඒ සඳහා විශේෂ හැකියාවක්, මනා සංයමයක් තිබිය යුතුයි කියා මං හිතනවා.

### පූර්ණ කාලීනව නිවේදන වෘත්තීය හැරදමා අද ඔබ වරාය අධිකාරියේ සේවයට පිවිසිලා..?

පූර්ණ කාලීන නිවේදකයෙක් ලෙස ඉන්නට තිබුනානම් එය තමයි මගේ ජීවිතේ මං ලැබු හොඳම භාග්‍යය කියා. ඒත් මං වරාය අධිකාරියට ප්‍රවිෂ්ඨ වීමත් සමග අංශ දෙකක ගමන් කිරිමට මට හැකියාව ලැබී තිබෙනවා. මං ජීවත්වෙන්නේ නිරතුරුවම නිවේදන වෘත්තිය සමග නමුත්, මං කිසිම දවසක මං නිවේදන ක්ෂේත්‍රය වෙනුවෙන් මගේ වෘත්තීයේ කිසිදු රාජකාරියක් පැහැර හැර නැහැ. ඒ වගේම මට පැවරෙන කටයුතු උපරිමයෙන් සිදු කිරීමට ඇප කැප වී සිටිනවා. අද දවසේ මා සේවය කරන සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශයේ ඉහළ නිලයේ සිට මා හට ඒ සඳහා අනූපමේය සහායක් ලැබෙනවා.

### කෙසේ ද ඔබගේ නිවේදන භූමිකාවට වරාය තුළ ඇති අවකාශය..?

වරාය තුළ මා හට ලැබෙන නිවේදන කටයුතු වලදි උපරිම දායක්වයකින් හා කැපවීමෙන් මං ඒ සඳහා දායක වෙනවා. බොහෝ හොඳ ප්‍රතිචාර අද දවසේ මං විඳිනවා.

### හෙට දවසේ ඔබේ නිර්මාණ කටයුතු පිළිබඳ කතා කළොත්...?

ජාතික රූපවාහිනියේ වැඩසටහන් කිහිපයකට ම ආරාධනා ලැබ තිබෙනවා. ඒ වගේම දූනට සිදුකරන නිවේදන කටයුතු ප්‍රශස්ත මට්ටමෙන් කරගෙන යාමට බලාපොරොත්තු වෙනවා. සම්මානනීය නිවේදකයකුගේ තත්වයට පත්වීමට අවැසි ගමන් මග මනා ඉවසීමෙන් ඒ පිළිබඳ ඉගැනීමෙන් හා අත්දැකීම් ඔස්සේ ලබා ගැනීමට කටයුතු කරනවා.

### නිවේදන ක්ෂේත්‍රයේ දී ඔබට මුල්පොත කියවු ලබැදියන් පිළිබඳ සිහිපත් කළොත්..?

මගේ ආදරණීය අම්මා, තාත්තා, අක්කා මාමා ඇතුළු පවුලේ සියලු දෙනාත්, ජාතික රූපවාහිනියේ දයා මහින්ද ගුණතිලක සුරම්‍යා ජී මාපිටිය, ඇතුළු කාර්ය මණ්ඩලය ස්වාධීන රූපවාහිනියේ ලාල් හේමන්ත මාවලගේ මහතාත් මේ අවස්ථාවේ දී විශේෂයෙන්ම සිහිපත් කළ යුතුයි. ඒ වගේම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨ්‍යාශයේ සියලුම නිලධාරී මහත්ම මහත්මීන් හා සහෘද සේවක කැල සෙනෙහසින් සිහිපත් කරනවා.

**- ගුරු -**

# සුදී



ඓතිහාසික නවකථාව

පස්වන දිගහැරුම...

# සොලින් දහසක් ගොඩබට මාගම්තොට ගොඩවාය වරායෙන් ඇසුණු සෙනෙහසේ ගීතය

"බුද්ධං සරණං ගච්ඡාමි"
ධම්මං සරණං ගච්ඡාමි"

ඉපදිච්ච දොහේ ඉඳන් කණට වැටිච්ච බුදුන් සරණ යන ගාථා වලට බොහෝම හුරු මොකක්දෝ අමුතු ගාථාවක් ඈතින් ඇහෙද්දී සුධීර සසර පුරුද්දට වගේ ඒ පැත්තට ගැටුවා. සතා පිවුපාවෙක්වක් නැති දූපතක දී අහන්නට ලැබුණු එකම හඩක් ගාථාවක් වෙච්ච එකේ සතුටත් එක්ක සුධීරගේ දෑස් තාරුකා කැට දෙකක් වගේ දිලිහුණා.

අට පට්ටම් හැඩයක් ගත් අමුතු හැඩයේ මාළිගාවක් වගේ ගොඩනැගිල්ල දිහාට සුධීරගේ දෙපා එසවුණේ හීනයක ඇවිද යනවා වාගෙයි. ඈතින් පෙනෙන කඳු මුදුන් හිම පතනයේ සැඟවී තිබෙන හැටි සුධීරගේ හිතට පැහැබර සිතවිලි පොදියක්ම ගෙනාවා. සුදීගේ නේත්තරා දෙකෙන් මේවායේ ලස්සන දැක ගත්තානම් මොනතරම් නම් සතුටු වේවිද කියන සිතුවිල්ලෙන් මෙච්චරක් වෙලා තිබුණු හීන් සතුට උඩු සුළඟට ගහන් ගියා.

සුධීර ඇත්තෝ හිමින් සීරුවේ මල් මාවතේ පිය එසෙව්වා. දූලිකා තරමේ හිම කැට මූණේ වදින දොහේ හිතට දැනිච්ච අමුත්තට සුධීරගේ මුලු ඇඟම සලිත වුණා. එකක් උඩ එකක් තැබූ වාටි ආප්ප කන්දක් උඩ තැබූ තුන් හුලස් පෙට්ටියක් තැබුවා වැනි වූ ඒ ගොඩනැගිල්ල විරාජමාන වූ තේජවන්ත පෙනුමෙන් සුධීර භය වී බලා සිටියා. වහලයේ එල්ලා තිබූ පළිගු සැරසිලිවල අලංකාරේ වචනයෙන් කියාගන්න බැරිතරම්. ගෝත පබ්බත විහාරේ චිත්‍රකර්මවල වැඩ ඉන්න බුදු හාමුදුරුවන්ට වඩා බොහෝම සුකුමාල විදියට චිත්‍ර කර්මෙට නගාපු බුදුහාමුදුරුවන්ගේ චිත්‍ර දිහා කොයියම් වෙලාවක් නේත්‍රා වලින් අනිමිස පූජාවේ හිටියත් මදිවාගෙයි. විනිවිද පේන විදියට ඇඳපු චීවර පල්ලෙන් ශ්‍රී සරීරේ පෙන්නේ බොහෝම ගරු ගාම්භීර විදියක් හිත පුරාම වඩෝමින්. චිත්‍ර කර්ම දිහා කොයි තරම් වෙලාවක් බලාන ඉන්න ඇද්ද කියා සුධීර ඇත්තොට හිතුණේ අමුතු විදියේ බාජු ඇඳුම් දාගත්ත කොලු ගැටව් රංචුවක් බය බූත වෙලා තමුන් දිහා බලාන හිටිය හන්දයි. කොලු පැටව් රංචුව උන්ගේ භාෂාවෙන් මොන මොනවදෝ ඇහුවා. ඒත් සුධීර ඇත්තන්ට ඒ හරුප තේරුණේ නැතිවා.

" මං බොලං සිරිලංකා දීපයෙන්

මගේ නෞකාව කුණාටුවකට අහුවෙලා මුහුදුබත් වුණා... ඊට පස්සේ මං මේ අමුතු දීපෙට ගහගෙන ආවා..."

හැකි තරම් අතින් පයින් චලන මුද්‍රා පෙන්නමින් සුධීර කොල්ලෝ කුරුට්ටන්ට තමුන්ගේ කතාව කියන්න හැදුවා. ඒත් උණේ ඒකේ අනිත් පැත්ත කොල්ලෝ කුරුට්ටෝ ටික සුධීර ඇත්තන්ගේ අමුතු නැටුමට කොක් හඩදීදි හිනාවුණා. සමහරුන්ගේ ඇස්වලින් කඳුළුත් පැන්නා. මං බොලාට හිනා වෙන්න දෙයක් කිව්වේ නෑ යකුනේ. හිතට ආපු කේන්තිය උහුල ගන්න බැරුව සුධීර ඇත්තේ උඩුබුරුලාන්න පටන් ගත්තා. ඒ පාර නම් කොල්ලෝ ටික මීයට පිම්බා වාගේ නිශ්ශබ්ද වුණා. එතකොට පුංචිම කොලුවෙක් කට ඇරියා.

"නමෝ තස්ස භගවතෝ අරහතෝ

සම්මා සම්බුද්ධස්ස ..."

සුධීරගේ ඇස් මොරගෙඩි තරම් ලොකු වුණා. එහෙනම් දෙයියනේ මේ සාමනේර පැටව් ටිකක්... අනේ සාදු ..... උමතුවෙන් වගේ දොහොත් මුදුන් තියාගත්ත සුධීර ඇත්තෝ නමස්කාරේ විතරක් නොවේ පන්සිල් පදත් ගෝතබ්බත විහාරේ පොඩි හාමුදුරුවන් වගේම බොහෝම සාදු නාදයෙන් ගැයුවා. සුධීරගේ ගාථා විලාසයන් අහපු සාමනේර පෙළ එක පෙළට නැමි නැමි සුධීරට ආචාර කරන්න පටන් ගත්තා.

" මේ මොන විකාරයක් ද බොලව්"..


එක්ක පලයව් උබලයි මහ එකා ලඟට .. සුධීර ගෝරනාඩු කළා. ඒ අතරවාරයේ බර අඩි තිය තියා කවුදෝ ආවා.

"ත්වං ආගම්මෙයි"

අහං සීහල දීපං ආගච්ඡාමි"

හිච්චි සංදියේ නන්ද හාමුදරුවන්ගෙන් වන පොත් කරපු පාලි පාඩම් වෙනත් දීපෙක දී ඕනෑ වේවිය කියා කවුද හිතුවේ.. ලෝගුවක් වගේ අමුතු තාලේ සිවුරක් දමා ගත්තු මහා සාමි පස්සෙන් සුධීර ඇත්තොත් පා එසෙව්වා...

"මයේ අම්මා. මයේ අම්මා"



"මොකෝ උඹ මේ කෑ මොර දෙන්නේ"

"අනේ මයේ අම්මා මගේ හිත බය බෝමා. අපුච්චලා නැව් නැගි දොහේ පහුවෙලා පෝය හඳවල් නං කීයක් ගෙවෙන්නැති කියලද මයේ අම්මා හිතන්නේ නැතිවා.."

"බොල සුදියේ බොට නොකීවාට මයේ හිතේ කැකෑරෙන ගින්දර සුමේ උඹට පේන්නේ නැතිව ඉන්න මං විඳින දුක උඹ දන්නේ නැතිවා."

මයේ අම්මා වාසලට චූරණ තනන්න යන දොහේ විස්තර අහගන්න බැරිවා"

"වාසල ඇතුලෙත් එකේක ජාතියේ ගට්ටං ගට්ටං කියලා හැමෝම රහස් කන් කතාවෙනවා. බිසෝ උන්නාන්සේත් බලාගත්ත අත බලාගෙන ඉන්නවා... ඒ විතරක් යෑ... නෑ...

මහතනි තමුන්ගේ කතාව අතරමග නවත්තා මැටි තලපෙට සඳුන් අරටුවෙන් පහර දෙන්න පටන් ගත්තා. වේලපු හුඹස් මැටි ඉර අව්වේ හොඳහැටි වේලා කුඩු කරගෙන සඳුන් කුඩුත් සම සමව අරන් කිරි දියරෙන් කලවම් කොරලා හදන මහතනීගේ මැටි චූර්ණේ රජ වාසලේ බවලතුන්ගේ නැතිවම බැරි මෙවලමක්.

ඔය මොණ චූර්ණ විච්චූර්ණ නැතත් තමුන්නේ දෝනියන්දා කොතරම් රූප සොබාවට ඉන්නවද කියලා මහතනීට හිතුනේ ඈත ආකාශේ දිහා බලාගෙන ඉන්න සුදි දැක්කහමයි.

"සුදියේ......"

"මොකෝ මයේ අම්මා"

මං මේ කියන දේවලින් උඹ හිත තලා ගන්නේ නැතිවා. උඹ පතන මාළිගාවේ හුඟ දෙනෙක් ඇහැ ගහන් ඉන්නේ. ඔය තනිපංගලමේ බාධක තිරේ එහේ මෙහේ යන්නේ නැතිව ඉන්න හොඳා".

"එහෙමයි අපේ අම්මා... මාත් අම්මට මේවා කියන්න බැරිව හිටියේ. අපේ සල්පිලේ දී ගැල් සාත්තු ඇත්තෙකුත් මං හදි කරන්න හිතුවා"

"කවුද බොල ඒ පර බල්ලා.. මං හිටියනං උගුව මන්න පිහියෙන් කීතු කීතු කර දානවා."

"හැමදේම ඔහොම කලබල වෙලා විසඳන්න බැරිවා. සුධීර ඇත්තෝ නොහිටින්න මාත් ඔහොම තමයි මයේ අම්මා කෝප ගන්නේ... ඒත් ඒ ඇත්තෝ මට ජීවිතේ කියා දුන්නා. අපේ එදිරිකාරයන්ව මලක් විදියට දකින්න ඒ ඇත්තෝ මට ඉගැන්නුවා... මම හැමෝටම මෙත් වඩනවා. ඒ මෛත්‍රී සිහිලට හැමදේම යටයි මයේ අම්මා..."

මහතනී සුදි දිහා බලාන උන්නේ දේව මාතාව දිහා බලනවාටත් වඩා ගරු සරුවෙන්. මේ තරම් පැටි වයසක දී ජීවිතේ දිහා මේ විදියට බලන්න පුලුවන් හිත බොහෝම ඉහලට පුරුදු පුහුණු කළ එකියකට විතරක් කියා මහතනි අත්දැකීමෙන් ම දන්නවා දෝනියැන්දා තමුන්ට වඩා බොහෝම ඉදිරියට ගිහින් තියෙන වග දැණුනු සතුටෙන් මහතනි උඩ ඉන්න දෙවියන්ට නමස්කාර කළා.

උපුල් ගුරුගේ

තීර්ථ



## මානව සම්පත් කළමණාකරණ ඩිප්ලෝමාධාරීන්ට සහතිකපත්

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මහපොළ වරාය හා සමිද්‍රි විද්‍යායතනය විසින් මෙහෙයවන ලද මානව සම්පත් කළමණාකරනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලවේ ඩිප්ලෝමාධාරීන්ට සහතික පත් ප්‍රදානය කිරීම වරාය හා නාවික අමාත්‍ය මහින්ද සමරසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් එම ශ්‍රවනාගාරයේ දී පැවැත් වූ මොහොත.

# ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බහලු මෙහෙයුම් නඩත්තු අංශයේ සේවක දායකත්වයෙන් Low Bed Trailer යන්ත්‍රයක් නිපදවයි

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් කොට් ඨාශයේ බහලු මෙහෙයුම් නඩත්තු අංශයේ සේවක මහතුන්ගේ දායකත්වයෙන් Low Bed Trailer යන්ත්‍රයක් නිෂ්පාදනය කරන ලදි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ භාවිතයෙන් තොර යකඩ යොදා ගනිමින් මෙම ටේලර් යන්ත්‍රය නිෂ්පාදනය කිරීම විශේෂත්වයකි.



බහළු මෙහෙයුම් නඩත්තු අංශයේ බහුවිද නිපුණතා ශිල්පි රෝහන පුෂ්ප කුමාර මහතාගේ නිර්මාණ දායකත්වයෙන්, පරිපාලක කේ.පී.එස්. රත්නායක මහතාගේ මග පෙන්වීමෙන් ඉදිකළ මෙම ටේලර් යන්ත්‍රය නිෂ්පාදන තුළින් මිලියන 05ක පමණ ඉතිරියක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අත්පත් තර දීමට මෙම සේවක මහතුන් හට හැකිවීම විශේෂයෙන් අගය කළ යුතුය. සාමාන්‍ය ටේලර් යන්ත්‍රයකට වඩා වැඩි ධාරිතාවයක් මෙමගින් දැරිය හැකිය.



# ගාලු වරායෙන් ගැලූ දරු සෙනෙහස







''කරදර විපත් එන්නේ නොකියාමයි. එක දිගටම ගැලු ගංවතුර බැහැලා ගියේ ඇඳන් හිටිය වස්තරයට හැම වත්කමක්ම සීමා කරන්. ඉතින් එහෙම තත්වෙක ඉස්කෝලේ පොත්පත් සුදු ඇඳුම් ගැන මොන කතාද.. ආයෙමත් ඉස්කෝලේ යන එකත් හීනයක් වගේ...'' මෙහෙම හිතාගෙන හිටිය බිලු මැන්ඩල් කණිටු විදුහලේ දරු පැටවුන්ගේ හීන හැබෑ කරන්න මනුස්සකම දන්න අපේම සහෝදර පිරිසක් එකතු වුණා. ඒ තමයි ගාල්ල වරායේ අපේ සහෘද සේවක පිරිස ඔවුන්ගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් පාසලේ සියලුම දුවා දරුවන්ට ගංවතුරින් ගහගෙන ගිහිපු පොත්පත් වෙනුවට අලුත්ම අලුත් පාසැල් පෙළපොත්, අමතර කියවීම් පොත්, ලියන පොත්, පෑන් පැන්සල්, නිල ඇඳුම් සපත්තු, මේස් ... කෑම බීම කන්දරාවක් අරගෙන හිමිදිරි උදෑසන ''ගාලු නඬේ'' බිලුමැන්ඩල් විද්‍යාලයට ආවා. හරි හමන් විදියට සුදු ඇඳුම් නැතිව සන්තකේ තියෙන පාට ඇඳුම් ඇඳගෙන ඉස්කෝලෙට ඇවිත් හිටිය දරු පැටව් ටික දැක්කම හැමෝගෙම පපු පිච්චිලා යනවා... ඒත් තමන් මේ පොළවට දැනෙන යමක් කළ බව එදා ඒ හැමෝගෙම හෘද සාක්ෂියට දැනෙන්න ගත්තා.

ඒ ජාතික පුවත්පතක පළවු තොරතුරක් ඔස්සේ සැබවින්ම ඒ උතුම් කටයුත්තට දායක වුණු ගාල්ල වරායේ සියලු දෙනාටම තීර්ථ ප්‍රණාමය පුද කරන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියලුම දෙනා වෙනුවෙන්.

**සටහන -උපුල් ගුරුගේ**

# කොළොම් තොටින් සමු ගන්න ද හැදවතින් අප ඔබ සමගයි

## පසුගිය දා වරාය අධිකාරියේ සේවයෙන් සමුගත් සේවක මහත්ම මහත්මීන්


සැපයුම් කොට්ඨාශයේ සේවය කළ එස්.ගුණරත්න මිය, වරාය සේවයෙන් සමුගත් දා...


විජය කුමාර පාලමේ සේවය කළ ජී. ගමිලත් මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


ප්‍රධාන මූළුතැන්ගෙය හි සේවය කළ ජී.ආර්. නිමල් මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


වඩු කාර්මික අංශයේ සේවය කළ බී.එන්.ඒ. මෙන්ඩිස් මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


ජයබහළු පර්යන්තයේ සේවය කළ එච්.හේමදාස මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


ගුදම් ගබඩා අංශයේ සේවය කළ එච්.බී. ජයසුන්දර මහතා, වරාය සේවයෙන් සමුගත් දා...



පෑලියගොඩ ගුදම් අංශයේ සේවය කළ කේ.ඒ. ප්‍රේමතිලක මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


මානව සම්පත් කොට්ඨාශයේ සේවය කළ ලලනි ද සිල්වා මහත්මිය, වරාය සේවයෙන් සමුගත් දා...


ජය බහලු පර්යන්තයේ සේවය කළ ඊ.ඒ. එදිරිසිංහ මහතා, වරාය සේවයෙන් සමුගත් දා...


සමගි බහලු පර්යන්තයේ සේවය කළ ඊ.ඒ. ගුණවර්ධන මහතා, වරාය සේවයෙන් සමුගත් දා...



ජයබහළු පර්යන්තයේ විදුලි අංශයේ සේවය කළ එම්.ඒ. යසපාල මයා, වරාය සේවයෙන් සමුගත් දා...


සුභ සාධක කොට්ඨාශයේ සේවය කළ එම්. ගුණපාල මයා, වරාය සේවයෙන් සමුගත් දා...


ප්‍රධාන මූළුතැන්ගේ හි සේවය කළ එම්.ඊ. කල්‍යානරත්න මයා, වරාය සේවයෙන් සමුගත් දා...


ජයබහළු පර්යන්තයේ සේවය කළ ජී.ඒ. පෙරේරා මයා, වරාය සේවයෙන් සමුගත් දා...


ප්‍රධාන මූළුතැන්ගේ හි සේවය කළ නන්දසේන මයා, වරාය සේවයෙන් සමුගත් දා...


මෙහෙයුම් කොට්ඨාශයේ සේවය කළ ජෙෆ්රි මයා, වරාය සේවයෙන් සමුගත් දා...


මුදල් කොට්ඨාශයේ සේවය කළ ධර්ම ශ්‍රී මයා, වරාය සේවයෙන් සමුගත් දා...


මුදල් කොට්ඨාශයේ සේවය කළ සී. අමරතුංග මයා, වරාය සේවයෙන් සමුගත් දා...


ජයබහළු පර්යන්තයේ සේවය කළ ඇපා මයා, වරාය සේවයෙන් සමුගත් දා...


පෑලියගොඩ ගුදම් අංශයේ සේවය කළ එස්.එම්. පොඩිනිලමේ මයා, වරාය සේවයෙන් සමුගත් දා...

## හෙළුඃ දහඩිය කඳුළු මුතු ඇට - ගෙවුණු පන්තිස් වස පුරා එකතු කර රන් කර පුදන්නෙමු - ඔබෙ දිරිය අගයනු නිසා

### වරායේ රන් පවුම් ලාභියෝ

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යක්‍ෂම මෙහෙයුම් ක්‍රියාවලිය සවිබල ගන්වන්නට ස්වකීය දහඩිය සුසුම් කැප කළ කොළඹ වරාය, ගාල්ල වරාය සහ ත්‍රිකුණාමලය වරාය සාර්ථකත්වයට කැප වූ සේවක මහත්ම මහත්මීන් රනින් අගයමින් හරසර දක්වීම පසුගිය දා මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතන ලලිත් ඇතුලත්මුදලි ශ්‍රවණාගාර පරිශ්‍රයේ දී අභිමානවත් ලෙසින් සංවිධානය කර තිබුණි.

හිටපු වරාය හා නාවික ගරු අමාත්‍ය අර්ජුන රණතුංග මැතිතුමාගේ සහ වරාය හා නාවික නියෝජ්‍ය අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම උත්සවයේ දී සභාව ඇමතූ අර්ජුන රණතුංග මැතිතුමා, ''**ජාතියේ හදවතට ජීවය දෙන සේවක ඔබ සියළුදෙනා වරාය අධිකාරියේ උන්නතිය වෙනුවෙන් ලබාදුන් දායකත්වය උදෙසා රනින් අගයන මෙම අවස්ථාවට සහභාගි වීමට ලැබීම තමා ලැබූ භාග්‍යයක් බවත් වරායෙන් සමුගත්ත ද ඔබ වරායට ලබාදුන් අනගි මෙහෙවර විශිෂ්ඨ වූවක් බැව් පැවසීය.**''

මානව සම්පත් කොට්ඨාශය මගින් සංවිධානය කරනු ලබන මෙම සැමරුම් උළෙල වරාය සේවක මහත්ම මහත්මීන් හට ජීවිතයේ එක් වරක් පමණක් හිමිවන ස්වර්ණමය අවස්ථාවක් ලෙස හැඳින්විය හැකිය.

ඩබ්. අමරසේන මයා, ජී.ඩී.එස්. ජයසිංහ මයා, ජී.වී.ඩී.ජේ. විජයානන්ද මයා, ඩබ්.එම්. ජයසිංහ බණ්ඩා මයා, කේ. සරවනප්‍රභූ මයා, ජී.ජී.එල්. හේමචන්ද්‍ර මයා, ඒ.පී.එන්. චන්ද්‍රසිරි මයා, ඒ.එල්.එම්. මුස්තාෆා මයා, ආර්. ජයවීර මයා, එල්.ඒ.ජී. ප්‍රනාන්දු මයා, අයි. නිසාර්දීන් මයා, එම්.යූ.කේ. මෙහොමඩ් මයා, පී.එම්.ඒ. සරුක් මයා, එච්.ඒ. දයාරත්න මයා, ඒ.එම්.ආර්.එස්.පී. විජේරත්න මයා, පී. සිවසුන්දරම් මයා, එල්.එස්. සුසිලාවතී මිය, කේ.ජී. ජයන්ත මයා, ඒ.එල්. ගුණදාස මයා, පී.කේ.ආර්. කුමාර මයා, ආර්. පර්ජිත් මයා, ඩබ්.ඩී. ගුණරත්න මයා, එන්.ඩී. හේමචන්ද්‍ර මයා, ආර්.එම්.ඩී.ඒ. කිත්සිරි මයා, ආර්.ඩබ්.එච්. ධර්මපාල මයා, එච්.යූ. රත්නපාල මයා, ඒ.පී. විජේරත්න මයා, ඒ. සෙබෙස්තියන් මයා, ඒ.ඒ.එස්.පී. අමරසිංහ මයා, එම්.ඒ.සී. ඉක්බාල් මයා, එල්.සී. පෙරේරා මයා, ඩී.ආර්. හෙන්දාවිතාරණ මයා, එම්.ඒ.එස්. සිසිර මයා, ආර්.ඩී. රණසිංහ මයා, ඒ.බී.එම්. කල්‍යානර්රත්න මයා, එම්.ඒ. ප්‍රේමසිරි මයා, එච්.එස්. සේනාධීර මයා, පී.ඒ. බන්දුල මයා, එස්.කේ. අමරතුංග මයා, ඩබ්.ඒ.එස්. රෝහණ මයා, ඒ.කේ.එල්.එස්.ඩබ්. ගුණසේකර මයා, ඩබ්.ඒ.ඊ. වික්‍රමසිංහ මයා, ටී.එන්.ඩී. ද සිල්වා මයා, ඒ.එල්. කොතලාවල මයා, ඒ.ජී. නිමල්තිලක මයා, එල්.පී. දයාරත්න මයා, කේ.ඩබ්.ඩී.පී. ප්‍රනාන්දු මයා, ඩබ්.ඒ.එස්.ඩී. විජේසිංහ මයා, ඩබ්.සී.එන්. සිල්වා මයා, එම්.ජී. දිසානායක මයා, ඩබ්.ඩී. පීරිස් මයා, සී.ජේ.ඩබ්. සෙනෙවිරත්න මයා, පී.ඩී. දයාසේන මයා, එච්.ආර්.පී. ගුණරත්න මයා, ජේ.එෆ්. ප්‍රේමදාස මයා, ඩී.ආර්. පෙරේරා මයා, බී.ඒ.ආර්. ජයරත්න මයා, එම්.ඩී. විජේවංශ මයා, ඩබ්. හේවගේ මිය, ජේ.ජේ. කුමාර මයා, කේ.ඒ.එල්. සුනන්ද මයා, ජේ.ඒ.ජී.ඩී.වී.එල්.පී. නානායක්කාර මයා, එම්.ඔ.ඒ. ප්‍රනාන්දු මයා, එස්.එම්.ටී. බණ්ඩාර මයා, එම්.ඩබ්. තිලක් බන්දුල මයා, එල්.එස්. පෙරේරා මයා, ඩී.ඒ.කේ.ඩබ්. බස්නායක මයා, ඒ.ජේ. සෙනෙවිරත්න මයා, එච්. ආරියදාස මයා, ආර්.ඒ. සිරිල් මයා, එම්.ඩී. නන්දාවතී මිය, ඩබ්. සිරිපාල මයා, ඊ.ඒ.එල්. සොයිසා මයා, ඩබ්. සෝමරත්න මයා, කේ. ජයරත්න මයා, ජේ. රාජපක්ෂ මයා, ජී.එච්. සිරිල් මයා

## உலக அழிவு நெருங்கிவிட்டது

காரணமில்லா மனித கொலைகள் பெருகிவிட்டன!
அநியாயக் காரர்களின் அக்கிரமங்கள் கூடிவிட்டன!
மனித நேயம், இரக்கம், நேர்மை யாவும் தொலைந்து விட்டன!
சொந்தம், பந்தம் என்ற உறவுகள் கருகிவிட்டன!
நவீன இயந்திரப் போர்வை மானிட வாழ்வில் கருகிவிட்டன!
காலமும் நேரமும் மனித மனம் போல் சீர்கெட்டுவிட்டன!
பொன், பொருள் மட்டுமே போதும் என்ற நிலை நிலைத்துவிட்டன!
நற்குணம் கொண்ட சீர் சமூகம் மறைந்துவிட்டன!
மனித உயிர்கள் விலங்கு உயிரை விட மதிப்பற்று விட்டன!

இவையாவும் கூட்டிணைந்து தீமையைக் கருக்கட்டி விட்ட
இத் தருணத்தில் இனியும் என்ன மிஞ்சியுள்ளது?
அடுத்த கட்டம் ஒன்று பட்டால் உண்டு வாழ்வு போல்
மேற் சொன்னவை ஒன்றுபட்டால் உலக அழிவைத் தவிர
வேறு என்ன தான் நடக்க முடியும் இப்புவியில்

M.I. இஸ்ஸதீன்
உள்ளக கணக்காய்வுப் பகுதி

## முஸ்லிம் மஜ்லிஸ் இப்தார் நிகழ்விற்கு ஒதுக்கப்பட்ட நிதியை வெள்ளத்தால் பாதிப்புற்ற மக்களுக்கு வழங்குதல்



இலங்கை துறைமுக அதிகாரசபை முஸ்லிம் மஜ்லிஸ் இப்தார் நிகழ்வின் பொருட்டு ஒதுக்கிய பணம், வெள்ளத்தால் பாதிப்படைந்த மக்களுக்கு நன்கொடையாக வழங்கப்பட்டது.

இப்தார் நிகழ்விற்கென இலங்கை துறைமுக அதிகாரசபையால் வழங்கப்பட்ட ஒன்பது இலட்சம் ரூபாவுக்கு மேற்பட்ட தொகையினை இம்முறை இப்தார் நிகழ்விற்கு செலவு செய்யாது வெள்ளத்தால் அநாதரவாகியுள்ள மக்களுக்கு வழங்குவதற்கு துறைமுக அதிகாரசபையின் முஸ்லிம் மஜ்லிஸின் முகாமைத்துவம் தீர்மானித்தது.

இலங்கை துறைமுக அதிகாரசபையின் மஜ்லிஸ் இப்தார் நிகழ்வில் துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர் மஹிந்த சமரசிங்ஹவின் பங்குபற்றலுடன் இப்தார் நிகழ்வு மத வழிபாடுகளுக்கு முன்னுரிமை வழங்கப்பட்டு மிகவும் எளிமையான முறையில் இலங்கை துறைமுக அதிகாரசபையின் தலைவர் கலாநிதி பராக்கிரம திஸாநாயக்க அவர்கள் உட்பட பணிப்பாளர் சபை, உயர் அதிகாரிகள் மற்றும் இலங்கை துறைமுக அதிகாரசபையின் முஸ்லிம் ஊழியர்கள் மற்றும் வேறு மத ஊழியர்கள் தேசிய நல்லிணக்கத்தின் பொருட்டு இந்த சந்தர்ப்பத்தில் கலந்து சிறப்பித்தமை குறிப்பிடத்தக்க விடயமாகும்.

## “துறைமுக துறையினை தாய்நாட்டிற்கு முன் நிறுத்தி நாட்டு மக்களின் சுபீட்சத்தை நோக்கிய உறுதியான பயணமொன்றில்...”

துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர் மஹிந்த சமரசிங்ஹ அவர்கள் கடமை பொறுப்பேற்பின் போது கூறியுள்ளார்.



துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர் கௌரவ மஹிந்த சமரசிங்ஹ அவர்கள் சுப வேளையில் தனது அமைச்சின் கடமைகளைப் பொறுப்பேற்றார். துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சில் இந்த உத்தியோகபூர்வ நிகழ்வு மஹாசங்கத்தினர் முன்னிலையில், அமைச்சர்கள் மற்றும் பிரமுகர்கள் மத்தியில் இடம்பெற்றது.

கடமை பொறுப்பேற்றலின் பின்பு, ஊடகங்களுக்கு கருத்துத் தெரிவித்த கௌரவ அமைச்சர் அவர்கள் இலங்கையின் கேந்திர முக்கியத்துவமிக்க பொறுப்பு வாய்ந்த, சவால்மிகு அமைச்சாகிய துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சு தனக்கு வழங்கியமையையிட்டு அதிமேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களுக்கும் கௌரவ பிரதமர் ரணில் விக்கிரமசிங்ஹ அவர்களுக்கும் தனது மனமார்ந்த நன்றியைத் தெரிவித்தார்.

சவால்களுடனான இந்த அமைச்சின் பணிகளை தாய் நாட்டினை முன்நிறுத்தி நாட்டு மக்களின் சுபீட்சத்தை நோக்கிய திடமிகு பயணமொன்றிற்கு உட்படுத்தப்படும் எனவும் கூறினார்.

“சகல சவால்களையும் ஏற்று மத்தியஸ்த நிலையில் இருந்து சுமுகமாக பேச்சுவார்த்தையினால் பிரச்சினைகளை தீர்ப்பது எமது நோக்கமாகும்.” சகலரினதும் அர்ப்பணிப்புக்கு மத்தியில் இந்த விடயத்தை வெற்றியடைந்து கொள்வதற்கும் நிறைவேற்றிக் கொள்வதற்கும் முடியும், என்பது எனது நம்பிக்கையாகும். என்றும் கூறியுள்ளார்.

தொழிற்சங்கங்களுக்கு எந்தவொரு சந்தர்ப்பத்திலும் கலந்துரையாடுவதற்கு தனது அமைச்சின் சகல கதவுகளும் திறந்தே இருப்பதோடு, இதற்கு முன்பிருந்தவாறு துறைமுக மற்றும் கப்பற்றுறை அமைச்சின் கீழுள்ள சகல நிறுவனங்களினதும் அதிகாரிகள் மற்றும் உத்தியோகத்தர்களின் வினைத்திறன் மிகு அர்ப்பணிப்பு எதிர்வரும் காலங்களிலும் கிடைக்கும் என நம்புவதாகவும் கௌரவ அமைச்சர் அவர்கள் எடுத்தியம்பினார்.

By - M.F.F. Farzana

තීර්ථ

බාල උමංවරු


# අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලියේ විශිෂ්ඨතම ළමා කෘතිය උපුල් ගුරුගේ රචනා කළ ''සිංදු කියන අඹ ගෙඩිය'' ට





සම්මාන උළෙලට ජාතික සංහිදියාව අර්ථවත් කරමින් සංස්කෘතික අංග රැසක් ද, ප්‍රදර්ශන කුටි වැඩමුළු ආදි විශේෂාංග රැසක් ද විය.ශ්‍රී ලංකා වරාය අධිකාරියේ තීර්ථ පුවත්පතේ සංස්කාරක ධුරය උසුලන උපුල් ගුරුගේ චංදු, දළඹු බබා, දඟකාර මෝර පැටියා, ගාඩියි සිඳුයි, තැනට සුදුසු නුවණ ආදි ළමා සාහිත්‍ය කෘති මෙන්ම, සංගීතයේ හෙට දවස කේමදාස, ගමක වත, ජපන් සිනමාවේ කුරසෝවා සහ ඕෂු ඇතුළු පර්යේෂණ කෘති සහ නවකථා රැසක් ද එළි දක්වා ඇත.


අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලියේ විශිෂ්ඨතම ළමා කෘතිය ලෙස උපුල් ගුරුගේ රචනා කළ සිංදු කියන අඹ ගෙඩියට සම්මානය හිමිවිය. පසු ගියදා බත්තරමුල්ලේ ''අපේගම'' පරිශ්‍රයේ දී මෙම සම්මාන උළෙල අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි. අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය එස්.බී.නාවින්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ මෙම



සොබාදහමේ අපූර්වත්වය කැටි කර ගනිමින් ඕනෑම ජීවී අජීවී වස්තුවකට සමාජය වෙත කළ යුතු යුතුකම් හා වගකීම් ඇති බව ළමා මනසට ගෝචර කථා පුවතක් පදනම් කර ගනිමින් ''සිංදු කියන අඹ ගෙඩිය'' නිර්මාණය කර ඇත.

එක් පසකින් විද්‍යාත්මක ක්‍රියාවලියක් ළමා සාහිත්‍ය කෘතියක් ලෙසට නිර්මාණය වූ අවස්ථාවක් ලෙසට ද මෙය හැදින්විය හැකිය. සිංදු කියන අඹ ගෙඩිය නම් වූ චරිතය කේන්ද්‍ර කර ගනිමින් ළමා මනස පරිකල්පනයෙන් පුරවාලන ගීත සහ සිතුවම් ඇතුළත් සිංදු කියන අඹ ගෙඩිය දමිළ සහ ඉංග්‍රීසි බසට ද පරිවර්තනය කිරීමට නියමිතය.

## වරාය ගැන දැනගන්න
## www.slpa.lk වෙබ් අඩවියට පිවිසෙන්න



තොරතුරු පද්ධති කොට්ඨාශය මගින් යාවත්කාලීන වන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිල වෙබ් අඩවිය තුළින් ඔබේ දැනුමට අවශ්‍ය අතීතය, වර්තමානය හා අනාගතය යා කරන වරාය අධිකාරියේ පුවත් තතු ඔබට එසැනින් දැනගැනීමේ හැකියාව ඇත. එපමණක් නොව ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමග ගණුදෙනු කරන්නාවූ නැව් සේවාවන් හා ඒවායේ විස්තර තොරතුරු හා දුරකථන අංකයන් ප්‍රාදේශීය වරායයන් ලෙසින් ගාල්ල, ත්‍රිකුණාමලය, හම්බන්තොට වරායයන්ගේ සංවර්ධන කටයුතු පිළිබඳ ඔබට අවශ්‍ය දැනුම තොරතුරු ලබා ගැනීමට හැකියාව ඇත.

හෙට දවසේ දී තීර්ථ පුවත්පත්වල සංගෘහිත සාරගර්භ ලිපි වරාය පිළිබඳ වාර්තා විශේෂාංග ආදිය පරිශීලනයට ද අවකාශය ඔබට මෙම වෙබ් අඩවිය ඔස්සේ ලැබෙනු ඇත.



**මල් වත්ත**
ගාධිත්‍ය ගගුනෙත්
සුපිපි පෙර පාසල - මාතර



**වැවක දර්ශනයක්**
රෙසදි පෙහන්සා
Star Tots පෙර පාසල -මහර



**වර්ණ රටා**
ආවින් සෙනුල්
රන්මුතු පෙර පාසල - යක්කල



**අපේ ගෙදර**
සවුදා මක්ෂූඩ් - 1 වසර
ශාන්ත පාවුළු බාලිකා විදුහල -මීලාගිරිය




**මුහුදු පතුල**
සත්යුරු රණහස්
පාසල -මාතර



**රොකට් එක**
රම්තු අකේන්
3 වසර - බප/කැල/දුටුගැමුණු මහා විද්‍යාලය



**මගේ පවුල**
පූජානි ආදිත්‍යා
පෙර පාසල, බ්‍රිස්බන් ජාත්‍යන්තර පාසල



**මුහුදු වෙරළ**
චේත්‍යා ගගුනි
සුපිපි පෙර පාසල - මාතර



**අපේ ගෙවත්ත**
මින්හාරා සෙතුමිලි - 2 වසර
ශ්‍රී දේවරක්ෂිත ප්‍රා. විදුහල - පල්ලෙවෙල



**අපේ මුළුතැන්ගෙය**
නිමාලි හංසිකා
1 වසර - යශෝදරාදේවා බාලිකා විදුහල

# කෙළිබිම

**ශක්තිමත් ජවයේ සංයමය**

සටහන - රුක්ෂාන් සමරධීර

## ජනසතුසේවා ක්‍රිකට් සංගමයේ මුල් පුටුව නලින් අපොන්සු මහතාට



ඉකුත් දා පවත්වනු ලැබූ ජනසතුසේවා ක්‍රිකට් සංගමයේ නිලවරණයේ දි සභාපති තනතුර සඳහා නිතරගයෙන් නලින් අපොන්සු මහතා පත්වීය. පසුගිය වකවානුව තුළ ජනසතුසේවා ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් ඔහු සිදුකල මෙහෙවර ඉමහත්ය. මෙම නිලවරණයේ දී උපසභාපතිවරයෙකු ලෙස ජානක කුලකුරුසූරිය මහතා ද පත්වන ලදී.



වියට්නාමයේ පැවැත්වෙන ආසියානු අන්තර් සමාජීය (පිරිමි) වොලිබෝල් ශූරතා තරඟාවලිය - 2017 සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කණ්ඩායම ශ්‍රී ලංකාව නියෝජනය කරමින් පසුගිය දා දිවයිනෙන් පිටත් විය.

2017 ආසියානු අන්තර් සමාජීය (පිරිමි) වොලිබෝල් ශූරතා තරගාවලිය මෙවර, වියට්නාමයේ හැහෝයී හිදී පැවැත්වේ. මෙම තරගාවලිය සඳහා මෙවර ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වොලිබෝල් කණ්ඩායම ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභා ගීවීමට නියමිතය. ඔවුන් පසුගිය වසර 04ක් පුරා අඛණ්ඩව ජාතික වොලිබෝල් සුපර්ලීග් ශූරතාව ජයග්‍රහණය කළ කණ්ඩායම ලෙස ද වාර්තා වේ.

ජාතික පිළ නියෝජනය කරන ක්‍රීඩකයන් රැසකගෙන් සමන්විත මෙම කණ්ඩායමේ නියමිත සංචාරය සඳහා, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමග එක්ව කටයුතු කරන සහෝදර පර්යන්ත වන CICT සහ SAGT පර්යන්ත ද, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන පෙලේ සේවා ලාභි ආයතන වන, හේමාස් සමාගම, හේලීස් සමාගම, මැක්ලරන්ස් සමාගම, කොළම්බු ලොජිස්ටික් සමාගම, වින්ෂන් ඉන්ටර්නැෂනල් සමාගම, මාස්ටර් ඩයිවර්ස් ආයතනය, බ්‍රැන්ඩික්ස් ආයතනය, ක්ලැරියෝන් ලොජිස්ටික් ආයතනය, යූ.එස්.කාර්ගෝ එන්ටර්ප්‍රයිසස් ආයතනය සම අනුග්‍රාහකත්වය දක්වයි.



## ජනසතුසේවා පාපන්දු තරගාවලියේ ප්‍රවීනයන්ගේ ශූරතාව වරාය අධිකාරිය ට

ජනසතු සේවා A කණ්ඩායමේ සත් සාමාජික පාපන්දු තරගාවලියේ අවසන් මහා තරගයට ශ්‍රී ලංකා වරාය අධිකාරි කණ්ඩායම හා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩල කණ්ඩායම සුදුසුකම් ලබා ගන්නා ලදි. අවසන් මහා තරගය පසුගියදා නාවලපිටිය ජයතිලක ක්‍රීඩාංග නයේ දී පැවැත්විණි. එහිදි තියුණු තරගයකින් පසු ගමනා ගමන මණ්ඩලය වරාය අධිකාරි කණ්ඩායම පරාජය කරමින් ශූරයන් බවට පත් වූ අතර, වරාය අධිකාරිය කණ්ඩායමට අනු ශූරතාව හිමි විය.

එම තරගාවලිය ප්‍රවීනයන්ගේ සත්සාමාජික පාපන්දු තරගාවලියේ අවසන් මහා තරගය ශ්‍රී ලංකා වරාය අධිකාරිය කණ්ඩායම හා ශ්‍රී ලංකා ඛණිජ තෙල් සංස්ථාව අතර පැවැත්විණි. එහිදී 2-0 ලෙස ඛණිජ තෙල් සංස්ථා කණ්ඩායම පරාජය කරමින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රවීනයන්ගේ කණ්ඩායම සත් සාමාජික පාපන්දු තරඟවලියේ ශූරතාව හිමිකර ගන්නා ලදි.



2017 ආසියානු මේස පන්දු ශූරතා තරඟාවලිය පසුගිය දා චීනයේ දී පැවැත්විනි. ශ්‍රී ලංකා කාන්තා කණ්ඩායමේ නායකත්වය හිමිවූයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉෂාරා මදුරංගිටයි. එම තරඟාවලිය සාර්ථකව නිමකිරීමට හැකි වූ ඉෂාරා හට පසුගියදා පර්මනියේ පැවති ලෝක ශූරතා මේස පන්දු තරඟාවලිය සඳහා ශ්‍රී ලංකා මේස පන්දු කාන්තා කණ්ඩායම මෙහෙයවීමේ භාග්‍ය ද ඉෂාරාට හිමිවිය.

## සත්සාමාජික හොකී තරගයේ A කාණ්ඩයේ ජයග්‍රහණය වරාය අධිකාරියට



පසුගියදා ජනසතුසේවා හොකී සංගමය විසින් සංවිධානය කරනු ලැබූ සත් සාමාජික A කාණ්ඩයේ හොකී තරඟාවලියේ ජය ප්‍රබල SLTB කණ්ඩායම පරදා ලකුණු 01-02 ලෙස වරාය අධිකාරිය ජයගනු ලැබීය. වරාය අධිකාරියේ ක්‍රීඩකයන් මුළු තරඟාවලිය පුරාම කැපී පෙනෙන දක්ෂතා දක්වන ලදී. අවසන් තරඟය වෙන්නප්පුව ඇල්බඩ් එෆ් පිරීස් ක්‍රීඩාංග නයේ දී පැවැත් විනි.

## ජනසතුසේවා බැඩ්මින්ටන් ලීග් තරගමාලාව - 2017

ඉකුත්දා වෙළඳ සේවා බැඩ්මින්ටන් ක්‍රීඩා සංකීර්ණයේ පැවති ජනසතු සේවා බැඩ්මින්ටන් ලීග් තරඟමාලාවේ ශූරතා හතරක් දිනා ගනිමින් සමස්ථ තරඟාවලියේ පෙරමුන ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය බැඩ්මින්ටන් කණ්ඩායම සමත් විය. පුරා දින හතරක් කණ්ඩායම් විසි දෙකක සහභාගීත්වයෙන් පැවති තරඟමාලාවේ ප්‍රබල කණ්ඩායම් අභිබවා කැපීපෙනන දස්කම් දැක්වීමට ශ්‍රී ලංකා වරාය අධිකාරි කණ්ඩායම සමත්විය.

## ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ක්‍රිකට් කණ්ඩායම අවසන් තරගයට සුදුසුකම් ලබයි

ජනසතුසේවා ක්‍රිකට් සංගමය මගින් සංවිධානය කරනු ලබන ප්‍රවීනයන්ගේ ''ලීග්'' තරගාවලියේදී අවසන් පූර්ව තරගයේදී ප්‍රබල NW&DC කණ්ඩායම පරාජය කරමින් අවසන් තරගයට සුදුසුකම් ලැබීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමත් විය. පළමුවෙන් පන්දුවට පහරදුන් වරාය කණ්ඩායමේ ඉනිම ශක්තිමත් කරමින් අවන්ත උද්යෝග ලකුණු 92 ක් ද, ප්‍රියන්ත තිසේරා ලකුණු 53 ක් හා ශාන්ත කුමාරසිංහ 45 ක් ද රැස් කර ගනිමින් මුළු ලකුණු සංඛ්‍යාව 264 ක ප්‍රමාණයකට ගෙන යන ලදි.

පිළිතුරු ඉනිම ක්‍රීඩා කළ NW&DC කණ්ඩායමට සියළු දෙනා දැවී ලබා ගැනීමට හැකි වූයේ ලකුණු 158 ක් පමණි.

කොළඹ, ඩී.ආර්. විජේවර්ධන මාවතේ පිහිටි, සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ, වෙළඳ මුද්‍රණ අංශය මගින් මුද්‍රණය කරවා, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය මගින් ප්‍රසිද්ධ කරන ලදී.